# 8

## මූල්‍ය අංශයේ කාර්යසාධනය සහ පද්ධති ස්ථායිතාව

මූල්‍ය අංශය වසරේ මේ දක්වා අභියෝගකාරී ආර්ථික තත්ත්ව හමුවේ වුවද අවම සාර්ව ආර්ථික බලපෑම් සහිතව අඛණ්ඩව වර්ධනය විය. 2015 වසර අවසානයේ සිට 2018 වසරේ අප්‍රේල් මාසය දක්වා ක්‍රියාත්මක කළ දැඩි මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ප්‍රතිචාර දක්වමින්, බැංකු අංශයේ ණය සහ අත්තිකාරම්වල අඩු වූ වර්ධනය පිළිබිඹු කරගත් එම අංශයේ වත්කම් මධ්‍යස්ථ වේගයකින් වැඩි විය. මේ අතර, බාසල් III නියාමන යටතේ වැඩි වූ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතවලට අනුගත වීමේ අපේක්ෂා සමග බැංකු අංශයේ ප්‍රාග්ධනය වර්ධනය විය. තවද, බැංකු අංශයේ ද්‍රවශීලතා මට්ටම අවශ්‍ය අවම විචක්ෂණශීලී තත්ත්වවලට වඩා ඉහළ අගයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, වර්තමානයේ පාලනය කළ හැකි තත්ත්වයක පවතින වත්කම්වල ගුණාත්මකභාවයෙහි පවත්නා පහළ යෑම සඳහා සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ගැනීම සිදු නොකළහොත් එය බැංකු අංශයේ ලාභදායීත්වය සඳහා අහිතකර ලෙස බලපානු ලැබීමට ඉඩ ඇත. 2018 වසරේ පළමු මාස අට තුළ දී බැංකුවල ලාභදායීත්වයෙහි ද සුළු අඩුවීමක් නිරීක්ෂණය විය. ප්‍රධාන වශයෙන්, පවත්නා ඉහළ පොලී අනුපාතික, මධ්‍යස්ථව පවත්නා ආර්ථික වර්ධනය සහ ස්වාභාවික ආපදා හේතුවෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්යසාධනය මන්දගාමී විය. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ප්‍රාග්ධනය සහ ද්‍රවශීලතාව සතුටුදායක තත්ත්වයක පැවතියද එම අංශයේ වත්කම්වල ගුණාත්මකභාවය සහ ලාභ පහත වැටුණි. මෙම අංශයේ පවත්නා අඩු කාර්යසාධනයක් පෙන්වන මූල්‍ය ආයතන නැවත නගා සිටුවීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග මහ බැංකුව විසින් ගෙන ඇත. එසේම, බුන්වත් සමාගම් කිහිපයක් නිරාකරණය කිරීම සඳහා පියවර ගෙන තිබේ. ඒ අතර, මූල්‍ය පහසුකම් සඳහා වන ඉඩප්‍රස්තා වැඩි දියුණු කරමින් බැංකු ශාඛා ගණන, බැංකු නොවන මූල්‍ය සමාගම්වල ශාඛා ගණන සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ගණන මෙම කාලපරිච්ඡේදය තුළදී වැඩිවිය. රක්ෂණ සමාගම්, රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික අලෙවිකරුවන්, ඒකක භාර සහ කොටස් තැරැව්කරුවන් යනාදියෙන් සමන්විත අනෙකුත් මූල්‍ය ආයතන අංශය, සැලකිය යුතු ස්ථායීතා ගැටලුවලින් තොරව ව්‍යාපාර මෙහෙයුම් අඛණ්ඩව වර්ධනය කර ගන්නා ලදී. මේ අතර, වසරේ පළමු මාස නවය තුළදී දේශීය මුදල් වෙළඳපොළ සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්ව සාපේක්ෂව විචලන ස්වභාවයක් පෙන්වීය. දේශීය මුදල් වෙළඳපොළෙහි සැලකිය යුතු ද්‍රවශීලතා හිඟයක් නිරීක්ෂණය වූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පොලී අනුපාතික ඉහළ අගයක පැවතුණි. 2018 වසරේ පළමු මාස තුන තුළදී සාපේක්ෂව ස්ථායි මට්ටමක පැවති විනිමය අනුපාතිකය, ආනයනකරුවන්ගේ ඉහළ විදේශ විනිමය ඉල්ලුම සහ අඩු මට්ටමක පැවති විදේශ විනිමය ගලාඒම් හේතුවෙන් පසුකාලීනව සැලකිය යුතු ලෙස අවප්‍රමාණය විය. විදේශීය ආයෝජකයින්ට නැගී එන වෙළඳපොළ ආර්ථිකවලින් තම ප්‍රාග්ධනය ඉවත් කර ගැනීමට රුකුලක් වූ ලෝක වෙළඳපොළෙහි එ.ජ. ඩොලරයේ සිදු වූ ශක්තිමත්භාවය වැඩි වීම ශ්‍රී ලංකා රුපියල මත පීඩනයක් ඇති කිරීමට තවත් හේතුවක් විය. වැඩිදියුණු කළ ණය කළමනාකරණ උපායමාර්ග සහ රජයේ සුරැකුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාපටිපාටියේ වැඩිදියුණු වූ විනිවිදභාවය මාධ්‍යයේ වුවද, වෙළඳපොළ අපේක්ෂා මෙන්ම රජයේ අරමුදල්වල අවශ්‍යතාව සහ විදේශ මූල්‍යනය සිදුකිරීමේදී පවත්නා තත්ත්වයන්ගේ වෙනස්වීම පිළිබිඹු කරමින් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාත වසරේ පළමු මාස නවය තුළ දී මිශ්‍ර හැසිරීමක් පෙන්නුම් කරන ලදී. සලකා බලන කාලපරිච්ඡේදය තුළදී කොටස් වෙළඳපොළ දර්ශකවල කාර්යසාධනය විචලනය වන ස්වභාවයක් පෙන්නුම් කළ අතර, වසර තුළදී විදේශ ආයෝජකයන්ගේ අස්ථාවර ආයෝජන සමග මන්දගාමී විය. මෙම කාලය තුළ දී සාංගමික ණය වෙළඳපොළ සැලකිය යුතු ලෙස වර්ධනය විය. මූල්‍ය යටිතල පහසුකම් පිළිබඳව සලකා බැලීමේ දී, ගෙවීම් සහ පියවීම් පද්ධති සැලකිය යුතු බාධාවීම්වලින් තොරව නව තාක්ෂණික වැඩි දියුණුවීම් උපයෝගී කර ගනිමින් අඛණ්ඩව මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී.

## මූල්‍ය ආයතනවල වර්ධනයන්

### බැංකු අංශය


- ප්‍රාග්ධන හා ද්‍රවශීලතා මට්ටම් අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන්ට වඩා වැඩි මට්ටමක පවත්වා ගනිමින්, බැංකු අංශය අඛණ්ඩව වර්ධනය වූ අතර, එමගින් බැංකු අංශයේ අවදානම අවම කර ගැනීමේ හැකියාව තහවුරු කරන ලදී. ණය ලබාදීම් හා ආයෝජන කළඹ වලින් සමන්විත වන බැංකු අංශයේ සමස්ත වත්කම් පදනම ප්‍රධාන වශයෙන් තැන්පතු මඟින් මූල්‍යනය කරන ලද අතර, එය අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කළේය. 2017 වසරට සාපේක්ෂව වත්කම්වල වර්ධනය 2018 වසරේ මේ දක්වා මන්දගාමී තත්ත්වයක් පෙන්නුම් කළ අතර, අක්‍රීය ණය අනුපාතය ඉහළ යෑම මඟින් පිළිබිඹු වූ ලෙසට වත්කම්වල ගුණාත්මකභාවය පහළ වැටුණි. මේ අතර, ඉහළ ශුද්ධ පොලී ආදායම හා සැලකිය යුතු විදේශ විනිමය ලාභ හේතුවෙන් පළමු මාස අටක කාලය තුළදී බැංකු අංශයේ ලාභදායීත්වය ආන්තික ලෙස වැඩි විය. ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ජාලයන්හි පුළුල්වීම තුළින් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා බැංකු අංශය සක්‍රීයව දායක විය. තවද, බාසල් III නියාමන රාමුව ක්‍රියාවට නැංවීම හේතුවෙන් බැංකු අංශයේ අවදානම අවම කර ගැනීමේ හැකියාව වඩා ශක්තිමත් කරන ලදී. යෝග්‍ය නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ වඩා ප්‍රබල අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග, බැංකු අංශයේ අවදානම අවම කර ගැනීමේ හැකියාව තවදුරටත් ඉහළ නැංවීමට දායක විය.

- 2018 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයේ වත්කම්වල සිදු වූ වර්ධනය, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ වර්ධනයට වඩා මන්දගාමී විය. 2018 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයේ මුළු වත්කම් රුපියල් ට්‍රිලියන 11.0 දක්වා සියයට 7.3 කින් වර්ධනය වූ අතර, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එම වර්ධනය සියයට 9.4 ක් විය. 2018 වසරේ පළමු මාස අටක කාලය තුළදී සිදු වූ වත්කම් වර්ධනය සඳහා ණය හා අත්තිකාරම්වල සිදු වූ වර්ධනය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ආයෝජනයන් හි සිදුවූ මන්දගාමීත්වය, බැංකු අංශයේ වත්කම් පදනම පුළුල් වීම සඳහා බාධාවක් විය. බැංකු අංශයේ වත්කම් පදනම, මූලික වශයෙන්, තැන්පතු ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 8.1 ක් හා ණය ලබා ගැනීම් ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 1.5 ක් මඟින් මූල්‍යනය විය. වත්කම්හි වාර්ෂික වර්ධනය 2017 වසර අවසානයේදී පැවති සියයට 13.8 සිට 2018 ජුනි මස අවසානයේදී සියයට 11.1 ක් දක්වා පහත වැටුණු අතර, 2018 අගෝස්තු මස අවසානය වන විට එය සියයට 11.5 ක් දක්වා වර්ධනය විය.

- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හඳුන්වා දෙනු ලැබූ මුදල් ප්‍රතිපත්ති සහ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාරයක් ලෙස 2017 වසර අවසානයේ සිට ණය වර්ධනය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් මධ්‍යස්ථතාවයක් පෙන්වීය. පසුගිය වසරේ පළමු මාස අටට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයේ ණයෙහි ඉහළ යන වර්ධනයක් දැකගත හැකි විය. 2018 වසරේ පළමු


**8.1 රූප සටහන**

**බැංකු අංශයේ දර්ශක**



**රූප සටහන 8.2**


**බැංකු අංශයේ වත්කම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.3 රූප සටහන**

**බැංකු අංශයේ ණය සහ අත්තිකාරම්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මාස අට තුළ බැංකු අංශයේ ණය වර්ධනය සියයට 10.5 කින් වර්ධනය වූ අතර, 2018 වසරේ අගෝස්තු මස අවසානය වනවිට සමස්ත ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 7.1 ක් දක්වා ඉහළ ගොස් ඇත. ණය වර්ධනයෙන් සියයට 74.0 ක දායකත්වයක් සැපයූ රුපියල් ණය මෙම කාලපරිච්ඡේදය තුළ සියයට 9.5 ක වර්ධනයක් වාර්තා කළේය. 2017 වසර අවසානයේ සියයට 16.1 ක් ව පැවති වාර්ෂික ලක්ෂ්‍යමය ණය වර්ධනය 2018 වසරේ ජූනි මස අවසානය වන විට සියයට 14.7 ක මධ්‍යස්ථ අගයක් ගනිමින් 2018 අගෝස්තු මස අවසාන වනවිට සියයට 15.7 ක් කරා ළඟාවීම මඟින් සුළු වශයෙන් යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කර ඇත. මෙම කාලපරිච්ඡේදය තුළදී රජය වෙත නිකුත්කරන ලද ණයෙහි අඩුවීමක් පෙන්නුම් කළද, පෞද්ගලික අංශයට සහ රාජ්‍ය ආයතන සඳහා බැංකු අංශය විසින් නිකුත්කරන ලද ණය වැඩිවීම හේතුවෙන් ණය සහ අත්තිකාරම්වල වර්ධනයක් පෙන්නුම් කරන ලදී. බැංකු කටයුතු අනුව, සලකා බලන කාලපරිච්ඡේදය තුළ ණය වර්ධනයෙහි ඉහළ යෑමට බැංකු අයිරා හා කාලීන ණයදීම් දායක වී ඇත. ඒ අනුව, පසුගිය වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 8.0 (රුපියල් බිලියන 70.5) ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළ බැංකු අයිරාවල සියයට 18.4 (රුපියල් බිලියන 133.6) ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. එසේම, කාලීන ණයදීම් 2017 පළමු මාස අට තුළදී වාර්තා කළ සියයට 14.5 සිට 2018 පළමු මාස අට තුළදී, සියයට 10.3 ක් දක්වා මධ්‍යස්ථ අඩුවීමක් පෙන්නුම් කරන ලදී. 2017 වසරේ පළමු මාස අට තුළදී බැංකු අංශයේ උකස් හා කල්බදු ලෙස ලබාදුන් ණය අත්තිකාරම්වල වර්ධනය පිළිවෙළින් 8.7 ක් හා 3.1 ක් ව පැවති අතර, එය 2018 වසරේ පළමු මාස අට තුළදී පිළිවෙළින් 8.1 ක් හා 9.4 ක් ලෙස ඉහළ යන ලදී. මේ අතර, බැංකු අංශයේ ණයදීම්, ප්‍රධාන වශයෙන් පරිභෝජනය (සියයට 19.7) තොග සහ සිල්ලර වෙළඳාම (සියයට 16.1), ඉදිකිරීම් (සියයට 13.9) නිෂ්පාදන (සියයට 10.2), සහ කෘෂිකාර්මික, වන සංවර්ධන හා ධීවර (සියයට 8.3) යන අංශයන්ට සිදු කරන ලදී. ණයදීම්, ආර්ථිකයේ ක්ෂේත්‍ර පහකට පමණක් ප්‍රධාන වශයෙන් සීමා වුවද, එක් එක් බැංකු ඒවායේ ව්‍යාපාර කටයුතු කිරීමේදී ආර්ථිකයේ විවිධ වූ අංශයන්ට ණය ලබාදී ඇති බව පෙනී යයි.

**8.4 රූප සටහන**

**බැංකු අංශයේ අරමුදල් මූලාශ්‍ර**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8


- **වෙළඳ කළඹෙහි රජයේ සුරැකුම්පත්වල ආයෝජන පහළයෑම හේතුවෙන් 2018 වසරේ පළමු මාස අට තුළදී ආයෝජන කළඹෙහි වර්ධනය මධ්‍යස්ථ මට්ටමක පැවතිණි.** ආයෝජනවල ඉහළයෑම, පසුගිය වසරේ පළමු මාස අටෙහි පැවති රුපියල් බිලියන 296.2 (සියයට 13.0) ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළ රුපියල් බිලියන 29.8 (සියයට 1.2) ක් විය. වාර්ෂික ආයෝජන වර්ධනය 2017 වසරේ අවසාන භාගයේ ඉහළ ගිය අතර, එය සියයට 12.5 ක වර්ධනයක් වාර්තා වූ නමුත්, 2018 අගෝස්තු මස අවසානයේදී එය සියයට 0.7 ක් දක්වා පහළ ගොස් ඇත. මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන පිළිවෙළින් රුපියල් බිලියන 21.8 කින් හා රුපියල් බිලියන 15.4 කින් පහළ යෑමක් පෙන්නුම් කළ අතර, වෙළඳ කළඹෙහි භාණ්ඩාගාර බැඳුම්කර වල සිදුකල ආයෝජන රුපියල් බිලියන 23.7 ක් දක්වා ඉහළ ගොස් ඇත. කෙසේ වුවද, කල්පිරෙන තෙක් රඳවා ගන්නා ආයෝජන කළඹෙහි භාණ්ඩාගාර බිල්පත් හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ඉහළ යෑමක් වාර්තාකර ඇති අතර, භාණ්ඩාගාර බැඳුම්කරවල පහළ යෑමක් අදාළ කාලපරිච්ඡේදය තුළ පෙන්නුම් කර ඇත.

- **බැංකු අංශයේ වර්ධනය ප්‍රධාන වශයෙන් තැන්පතු මඟින් මූල්‍යනය වූ අතර, එය 2018 අගෝස්තු අවසානයේදී සමස්ත වත්කම්වලින් සියයට 73.3 ක දායකත්වයක් දක්වන ලදී.** බැංකු අංශයේ තැන්පතු පදනම රුපියල් බිලියන 689.6 කින් වර්ධනය වූ අතර, එහි වර්ධන වේගය සියයට 9.3 ක අගයක් ගන්නා ලදී. තවද, මෙය මූලික වශයෙන් රුපියල් තැන්පතු වලින් සමන්විත විය. මේ අතර, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී මෙම කාලපරිච්ඡේදය තුළ ඉල්ලුම් හා ඉතුරුම් තැන්පතු වර්ධනය ඉහළ ගිය අතර, කාලීන තැන්පතුවල වර්ධනය අඩු විය. කෙසේ වුවද, ඉල්ලුම් හා ඉතුරුම් තැන්පතු මුළු තැන්පතු වල ප්‍රතිශතයක් ලෙස ගත් කල 2017 අනුරූප කාලපරිච්ඡේදයේ වාර්තා වූ සියයට 33.5 ක ප්‍රතිශතයට සාපේක්ෂව 2018 අගෝස්තු මස අවසානයේදී සියයට 32.7 ක් දක්වා අඩු වීමක් පෙන්නුම් කෙරිණි. කෙසේ වෙතත්, 2018 පළමු මාස අට තුළ බැංකු අංශයේ ණය ගැනීම් රුපියල් බිලියන 58.9 කින් අඩුවූ අතර, එය සියයට 3.7 ක සෘණ වර්ධනයක් පෙන්නුම් කරන ලදී. තවද, 2017 අනුරූපී කාලපරිච්ඡේදයේදී ණය ගැනීම්වල අඩුවීම රුපියල් බිලියන 92.2 ක් (සියයට -5.4) ක් විය. මුළු ණය ගැනීම්වල අඩු වීමට මූලික වශයෙන් බලපාන ලද්දේ සියයට 13.7 (එ.ජ. ඩොලර් මිලියන 898.6) කින් සිදු වූ විදේශ ණය ගැනීම්වල අඩුවීමයි. මෙම අඩු වීමෙන් සියයට 78.2 ක් පෙන්නුම් කරන ලද්දේ අක්වෙරළ බැංකු අංශයේය. මේ අතර, 2018 පළමු මාස අට තුළ රුපියල් ණය ගැනීම් සියයට 2.5 (රුපියල් බිලියන 14.8) ක වැඩි වීමක් පෙන්නුම් කළ අතර, එයට මූලික වශයෙන් හේතු වූයේ බාසල් III රාමුවට අනුකූලව බැංකු මඟින් නිකුත්කළ ණයකරවල රුපියල් බිලියන 33.3 ක වැඩිවීම හා රුපියල් බිලියන 16.6 ක ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් පියවීම් වල ශුද්ධ බලපෑමයි.

- **වත්කම්වල ගුණාත්මකභාවයේ පහළ යෑමක් පෙන්නුම් කළද එය කළමනාකරණය කළ හැකි මට්ටමක පැවතිණි.** 2017 වසර අවසානයේදී රුපියල් බිලියන 160.7 ක් වූ අක්‍රීය ණය 2018 අගෝස්තු මස අවසානයේදී රුපියල් බිලියන 93.9 කින් රුපියල් බිලියන 254.6 ක් දක්වා වැඩි විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2017 අවසානයේදී සියයට 2.5 ක අගයක් ගත් අක්‍රීය ණය අනුපාතය 2018 අගෝස්තු අවසානයේදී සියයට 3.6 ක් දක්වා වැඩි විය. 2014 සිට 2015 දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ අක්‍රීය ණය අනුපාතයේ සියයට 4 සිට සියයට 6 දක්වා වූ වර්ධනය හා සැසඳීමේදී මෙම කාලපරිච්ඡේදය තුළ සිදු වී ඇති අක්‍රීය ණය අනුපාතයේ වැඩි වීම කළමනාකරණය කර ගත හැකි මට්ටමක පවතී. 2018 ජුනි මස අවසානයේදී ඉහළ අක්‍රීය ණය අනුපාතය සංචාරක (සියයට 5.5), නිෂ්පාදන (සියයට 5.4), තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන

**8.5 රූප සටහන**

**බැංකු අංශයේ අක්‍රීය ණය**





මූලයː ශ්‍රී ලංකා මහ බැංකුව

8

සේවා (සියයට 5.1), තොග හා සිල්ලර වෙළඳාම (සියයට 4.7) හා කෘෂිකර්ම, වන සම්පත් හා ධීවර කර්මාන්තය (සියයට 4.4) යන අංශ වලින් වාර්තා විය. කෙසේ වුවද, 2017 අගෝස්තු මස අවසානයේදී සියයට 48.0 හා සියයට 66.2 ක් ලෙස පිළිවෙළින් වාර්තා වූ විශේෂිත වෙන් කිරීම් අනුපාතය හා සමස්ත වෙන්කිරීම් අනුපාතය 2018 අගෝස්තු මස අවසානයේදී පිළිවෙළින් සියයට 38.6 ක් හා සියයට 52.2 ක් දක්වා අඩු විය. අලුතින් ඇති වූ අක්‍රීය ණය විශේෂයෙන් සඳහන් කර ඇති අක්‍රීය ණය ගනයට වර්ග කිරීම හේතුවෙන් එම අක්‍රීය ණය සඳහා අමතර වෙන් කිරීමක් අවශ්‍ය නොවන බැවින් අක්‍රීය ණයවල වැඩිවීමට සාපේක්ෂව අක්‍රීය ණය සඳහා වූ වෙන්කිරීම් ඉහළ යෑමක් දක්නට නොලැබිණි.

- **අවම නියාමන අවශ්‍යතාවට වඩා වැඩි ප්‍රමාණයකින් ද්‍රවශීලතාවය පවත්වා ගනිමින් බැංකු අංශය ක්‍රියාත්මක විය.** දේශීය බැංකු අංශයේ හා අක්වෙරළ බැංකු අංශයේ ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය අවම ව්‍යවස්ථාපිත අවශ්‍යතාව වූ සියයට 20.0 ට වඩා වැඩි අගයන්ගෙන් යුක්තව පිළිවෙළින් සියයට 30.0 ක් හා 40.5 ක් ලෙස අගෝස්තු මස අවසානයේදී පවත්වා ගන්නා ලද අතර, සමස්ත වත්කම්වලට සාපේක්ෂව ද්‍රවශීලතා වත්කම් අනුපාතය අගෝස්තු මස අවසානයේදී සියයට 27.4 ක් විය. තැන්පතුවලට ණය අනුපාතය 2017 අගෝස්තු මස අවසානය වන විට වාර්තා වූ සියයට 86.9 ට සාපේක්ෂව 2018 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 87.8 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. රුපියල් හා මුළු ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිවෙළින් සියයට 185.4 ක් සහ සියයට 151.2 ක් වූ අතර, එය සියයට 90.0 ක ව්‍යවස්ථාපිත අවම අනුපාතයට වඩා ඉතා ඉහළ අගයක පවත්වා ගන්නා ලදී.

**8.6 රූප සටහන**
**බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්වය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **විදේශ මුදල් වත්කම්වල වර්ධනයට සාපේක්ෂව විදේශ මුදල් වගකීම් අඩුමට්ටමකින් ඉහළ යෑමත් සමඟ, 2017 වසරේ අවසානයට සාපේක්ෂව 2018 ජූනි මස අවසානය වන විට බැංකු අංශයේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණය වීම වැඩිවීමක් පෙන්නුම් කරන ලදී.** 2018 වසරේ පළමු භාගයේදී ආයෝජන හා බැංකු ශේෂවල වර්ධනය නිසා මතුපිට ශේෂ පත්‍රයේ විදේශ මුදල් වත්කම් ඉහළ යෑමක් පෙන්නුම් කල අතර, ඉදිරි වෙළඳ ගිවිසුම්වල ඉහළ යෑම නිසා ශේෂ පත්‍ර නොවන අනාවරණ කිරීම්වල විදේශ විනිමය වගකීම්වල වර්ධනය වීමක් පෙන්නුම් කරන ලදී. 2018 ජූනි මස අවසානයේදී දේශීය බැංකු අංශයේ ශුද්ධ විදේශ විනිමය නිරාවරණ බැංකුවල නියාමන ප්‍රාග්ධනයේ හා මතුපිට ශේෂ පත්‍ර විදේශ විනිමය වත්කම්වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙළින් සියයට 2.4 ක් සහ සියයට 2.0 ක් විය. 2018 වසරේ ජූනි මස අවසානය වන විට බැංකු අංශය එ.ජ. ඩොලර් මිලියන 150.2 ක දිගු විදේශ විනිමය තත්ත්වයක් පවත්වා ගත් අතර, 2017 ජූනි අවසානයේදී එ.ජ. ඩොලර් 129.5 ක් විය. 2018 වසරේ පළමු මාස අට තුළදී ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන අතිරික්තය රුපියල් බිලියන 12.9 ක් විය.


- **2017 වසරේ පළමු මාස අට තුළ වාර්තා වූ රුපියල් බිලියන 3.4 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස අට තුළදී භාණ්ඩාගාර බැඳුම්කරවල ප්‍රාග්ධන ලාභය රුපියල් බිලියන 1.8 ක පහළ අගයක් පෙන්නුම් කරන ලදී.** මෙම අඩුවීමට මූලික වශයෙන් හේතු වූයේ 2018 පළමු මාස අටට සාපේක්ෂව 2017 පළමු මාස අට තුළ වූ රාජ්‍ය සුරැකුම්පත්වල පොළී අනුපාතිකයේ ඉහළ විචලතාවයයි. බැංකු අංශයේ කොටස් ආයෝජන ආදායම අවම අගයක් ගත් අතර, මෙයට ප්‍රධානම හේතුව වූයේ බැංකු අංශයේ රුපියල් බිලියන 19.1 ක් වූ වෙළඳ ආයෝජන කළඹ, සමස්ත වත්කම්වලින් හා වෙළඳ ආයෝජන කළඹ පිළිවෙළින් සියයට 0.2 ක් හා සියයට 3.0 ක් වීමයි.

- බැංකු අංශයේ බදු පසු ලාභය 2017 වසරේ රුපියල් බිලියන 138.9 ක් වාර්තා කළ අතර, 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී වාර්තා කළ රුපියල්

8

**8.7 රූප සටහන**

**බැංකු අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බිලියන 86.6 ක ලාභය 2018 පළමු මාස අට තුළ දී රුපියල් බිලියන 87.0 ක් දක්වා, රුපියල් බිලියන 0.4 කින් වර්ධනය විය. ශුද්ධ පොලී ආදායම සහ පොලී නොවන ආදායම පිළිවෙළින් රුපියල් බිලියන 37.3 කින් සහ රුපියල් බිලියන 7.2 කින් ඉහළ යෑම පසුගිය වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 වසරේ සලකා බලන කාලය තුළ අදායම ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවද, 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 වසරේ පළමු මාස අට තුළදී පොලී නොවන වියදම සහ අක්‍රීය ණය වෙන් කිරීම පිළිවෙළින් රුපියල් බිලියන 23.3 කින් සහ රුපියල් බිලියන 10.2 කින් වර්ධනය වීම හේතුවෙන් එහි බලපෑම නිෂ්ප්‍රභ විය. පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 0.7 හා සැසඳීමේදී මෙම කාල සීමාව තුළ දී, රුපියල් බිලියන 5.9 වූ විදේශ විනිමය ආදායමෙහි සැලකිය යුතු වර්ධනයක් දැකිය හැක.

- **බැංකු අංශයෙහි ලාභදායීත්වයෙහි සුළු වැඩිවීමක් පැවතියද ලාභදායීත්ව අනුපාත සුළු වශයෙන් අඩු විය.** බදු අඩු කිරීමට පෙර වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත 2017 අගෝස්තු මස අවසානය වනවිට පිළිවෙළින් සියයට 2.0 හා සියයට 17.6 ක සිට 2018 අගෝස්තු දක්වා පිළිවෙළින් සියයට 1.9 සහ සියයට 14.6 ක් දක්වා අඩු විය. කෙසේ වුවද, මෙම කාලය තුළ ශුද්ධ පොලී ආන්තිකය සියයට 3.5 සිට සියයට 3.7 ක් දක්වා පදනම් අගයන් 20 කින් ඉහළ නැංවුණි. මෙහෙයුම් වියදම් ඉහළ යෑම හේතුවෙන්, කාර්යක්ෂමතා අනුපාතය, 2017 වසරේ අගෝස්තු මස අවසානයේදී පැවති සියයට 46.2 ක සිට 2018 අගෝස්තු මාසයේදී සියයට 48.5 ක් දක්වා අඩු විය.

- **අවදානම් තත්ත්වයන් අවශෝෂණය කර ගැනීම සඳහා, බැංකු අංශය තුළ ප්‍රමාණාත්මක ප්‍රාග්ධනයක් 2018 වසරේ මුල් භාගය තුළදී පවත්වා ගන්නා ලදී.** 2018 වසරේ ජූනි මස අවසානය වන විට, බැංකු අංශයේ පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 12.7 ක් සහ මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සියයට 15.8 ක් ලෙස බාසල් III අවශ්‍යතාවන් ඉක්මවමින් පවත්වා ගන්නා ලදී. කෙසේ වුවද, බාසල් III යටතේ ඉහළ නැංවූ ප්‍රාග්ධන අවශ්‍යතා ළඟා කර ගැනීමේදී සහ මධ්‍ය

**8.1 සංඛ්‍යා සටහන**

**බැංකු අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 අගෝ. අවසානයට | 2017 අගෝ. අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2017 අගෝ. | 2018 අගෝ. (අ) |
| මුළු වත්කම් (රු. බිලියන) | 8,624 | 9,901 | 10,292 | 11,040 | 14.8 | 11.5 |
| ණය සහ අත්තිකාරම් (රු. බිලියන) | 5,092 | 6,140 | 6,431 | 7,104 | 20.6 | 15.7 |
| ආයෝජන (රු. බිලියන) | 2,428 | 2,588 | 2,577 | 2,608 | 6.6 | 0.8 |
| තැන්පතු (රු. බිලියන) | 5,855 | 7,063 | 7,399 | 8,089 | 20.6 | 14.5 |
| ණය ගැනීම් (රු. බිලියන) | 1,758 | 1,604 | 1,607 | 1,548 | -8.8 | -3.5 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 683 | 823 | 867 | 959 | 20.5 | 16.5 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 12.2 | 12.3 | 12.4 | 12.7 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) (ආ) | 14.7 | 15.1 | 15.2 | 15.8 | | |
| දළ අක්‍රීය ණය අනුපාතය (%) | 3.0 | 2.8 | 2.5 | 3.6 | | |
| ශුද්ධ අක්‍රීය ණය අනුපාතය (%) | 1.1 | 0.9 | 0.8 | 1.7 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) | 1.9 | 2.0 | 2.0 | 1.9 | | |
| හිමිකරු ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) | 16.9 | 17.6 | 17.6 | 14.6 | | |
| ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (දේශීය බැංකු ඒකක) (%) | 31.4 | 31.2 | 31.3 | 30.0 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 29.2 | 29.0 | 28.8 | 27.4 | | |


(අ) තාවකාලික
(ආ) ජූනි මස අවසානයට

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

8.8 රූප සටහන

බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාව




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කාලීනව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් හඳුන්වාදීමත් සමඟ ඇතිවන බලපෑම් හේතුවෙන්, බැංකු වලට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවනු ඇත.

- **මූල්‍ය කටයුතු සඳහා වන ප්‍රවේශය වර්ධනය කරමින් 2018 වසරේ මුල් භාගයේදී බැංකු ශාඛා ජාලය තවදුරටත් පුළුල් විය.** ඒ අනුව, නව ශාඛා 14 ක් විවෘත කරන ලද අතර, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 304 ක් 2018 වසරේ මුල් භාගයේදී ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ විදේශීය වාණිජ බැංකුවක් ලෙස බැංකු කටයුතු සිදුකිරීම සඳහා බෑන්ක් ඔෆ් චයිනා ලිමිටඩ් (Bank of China Limited) සඳහා නව බැංකු බලපත්‍රයක් නිකුත් කරන ලදී.

## බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය


- බලපත්‍රලාභී මුදල් සමාගම් 43 කින් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 5 කින්ද, ඒ යටතේ ක්‍රියාත්මක වන 1,355 ක ශාඛා ජාලයකින්ද සමන්විත බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ මුළු වත්කම්වලින් ආසන්න වශයෙන් සියයට 8.0 ක් නියෝජනය කරයි.

- **බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ව්‍යාප්තිය මන්දගාමී විය.** අඩු ණය වර්ධනය, අසාර්ථක බලපත්‍රලාභී මුදල් සමාගමක සැලකිය යුතු වටිනාකමක වත්කම් විකිණීම හේතුවෙන් ආයෝජන කළඹ පහළ යෑම සහ පවත්නා ද්‍රවශීල වත්කම් පහළ යෑම යනාදියෙහි ප්‍රතිඵලයක් ලෙස සමස්ත වත්කම්වල 2017 වසරේ පළමු මාස අට තුළ පැවති සියයට 7.8 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදයේදී එය රුපියල් බිලියන 1,406.7 දක්වා සියයට 3.8 (රුපියල් බිලියන 51.4) කින් පමණක් ඉහළ යෑමෙන් සමස්ත වත්කම්වල ව්‍යාප්තියෙහි අඩු වීමක් පෙන්නුම් කෙරිණි.

- **මෙම අංශයේ මූල්‍යන මූලාශ්‍රයේ මාරු වීමක් තවදුරටත් පෙන්නුම් කරන ලදී.** මෙම අංශයේ සමස්ත වත්කම් වලින් සියයට 42.0 ක් නියෝජනය කරමින් තැන්පතු ප්‍රමුඛස්ථානයක පැවතිය ද, මූල්‍යන

8.9 රූප සටහන


බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ දර්ශක




8

**8.10 රූප සටහන**


**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත තැන්පතු සහ ණය ගැනීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.11 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත ණය සහ අත්තිකාරම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


මූලාශ්‍රයෙහි මාරු වීමේ ලක්ෂණ පෙන්නුම් කරමින් මෙම අංශයේ සමස්ත ව්‍යාප්තිය ප්‍රධාන වශයෙන්ම ණය ගැනීම් හරහා මූල්‍යනය වී ඇත. 2017 වසර තුළ වාර්තා කළ ණය ගැනීම් වල සෘණ වර්ධනයෙන් අපගමනය වෙමින්, 2018 වසරේ පළමු මාස අට තුළදී ණය ගැනීම් සියයට 8.8 (රුපියල් බිලියන 34.9) ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2017 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළදී වාර්තා වූ සියයට 19.7 ක තැන්පතු වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළදී තැන්පතු වර්ධනය සියයට 1.1 දක්වා අඩු විය. නම්‍යශීලීත්වය සහ බලපත්‍රලාභී මුදල් සමාගම් කෙරෙහි මහජනයා තුළ පැවති සෘණාත්මක ආකල්ප හේතුවෙන් තැන්පතු හරහා අරමුදල් රැස් කිරීම අඩු වීම සැලකිල්ලට ගෙන මෙම අංශය තැන්පතු වලට වඩා බැංකු ණය කෙරෙහි වැඩි විශ්වාසයක් යොමු කර ඇත.

- **ප්‍රධාන වශයෙන්ම සාර්ව විචක්ෂණ ප්‍රතිපත්තීන්ගේ වෙනස් වීම සහ ආර්ථිකය මන්දගාමී වීම හේතුවෙන් ණය වර්ධනය අඩු මට්ටමක පැවතිණි.** මෝටර් වාහන ණය මත ක්‍රියාත්මක කළ සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති වල ප්‍රතිඵලයක් ලෙස මෙම අංශයේ ණය දීමේ කටයුතු පහළ යෑමේ ලක්ෂණ පෙන්නුම් කරන ලදී. 2017 වසරේ පළමු මාස අට තුළදී සියයට 5.9 කින් වර්ධනය වූ බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය මඟින් ප්‍රදානය කළ ණය 2018 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 1,125.0 දක්වා සියයට 6.4 (රුපියල් බිලියන 67.9) කින් සුළු වශයෙන් වර්ධනය විය.

- **අක්‍රීය ණය ඉහළ යෑමේ ප්‍රවණතාව තවදුරටත් එලෙසම පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.** 2017 වසරේ දෙසැම්බර් මස අවසානයට වාර්තා වූ සියයට 5.9 ක දළ අක්‍රීය ණය අනුපාතය ප්‍රධාන වශයෙන්ම ගං වතුර, දිවයින පුරා පැවති නියඟය සහ ආර්ථිකය මන්දගාමී වීම හේතුවෙන් 2018 වසරේ අගෝස්තු මස අවසානයේදී සියයට 6.9 දක්වා වර්ධනය වූ අතර, එය 2015 පෙබරවාරි මාසයට පසුව වාර්තා වූ ඉහළම අක්‍රීය ණය අනුපාතය විය. තවද, 2017 දෙසැම්බර් මස අවසානයේදී සියයට 61.9 ක් ලෙස වාර්තා වූ වෙන් කිරීම් ආවරණ අනුපාතයට සාපේක්ෂව 2018 අගෝස්තු මස අවසානයේදී එය සියයට 54.1 ක් දක්වා අඩු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, මෙම අංශයේ

**8.12 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ අක්‍රීය අත්තිකාරම්**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වත්කම් වල ගුණාත්මකභාවය පහළ යාමේ සළකුණු පෙන්නුම් කරමින් 2017 දෙසැම්බර් මස අවසානයට වාර්තා වූ සියයට 1.6 ක ශුද්ධ අක්‍රීය ණය අනුපාතය 2018 අගෝස්තු මස අවසානයට සියයට 2.2 ක් දක්වා වර්ධනය විය. අයහපත් කාළගුණික තත්ත්වයන් සහ 2018 අගෝස්තු මාසයේදී මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් දියත් කළ ණය සහන වැඩසටහන හේතුවෙන් අක්‍රීය ණය ප්‍රමාණය තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

- **බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සමස්ත ද්‍රවශීලතාව අතිරික්තයක් වාර්තා කළ නමුත්, ද්‍රවශීල වත්කම්වල අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ව්‍යවස්ථාපිත අවම ද්‍රවශීලතා අවශ්‍යතාව වන රුපියල් බිලියන 89.2 ට සාපේක්ෂව රුපියල් බිලියන 21.7 ක ද්‍රවශීලතා අතිරික්තයක් සහිතව මෙම අංශය රුපියල් බිලියන 110.9 ක සමස්ත ද්‍රවශීලතා වත්කම් ප්‍රමාණයක් 2018 වසරේ අගෝස්තු වන විට වාර්තා කරන ලදී. කෙසේ වෙතත්, ද්‍රවශීලතා අනුපාතය (තැන්පතු හා ණය ගැනීම් වලට ද්‍රවශීල වත්කම් දක්වන අනුපාතය) 2017 වසරේ දෙසැම්බර් මස අවසානයට වාර්තා වූ සියයට 11.7 ට සාපේක්ෂව 2018 වසරේ අගෝස්තු වන විට සියයට 9.9 ක් දක්වා අඩු විය. මෙම අනුපාතය අඩු වීමට හේතුව ලෙස පැවති ද්‍රවශීල වත්කම් ප්‍රමාණය සියයට 12.3 කින් අඩු වීම දැක්විය හැක.

**8.13 රූප සටහන**


**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ සමස්ත ද්‍රවශීල වත්කම් සහ ද්‍රවශීලතා අනුපාත**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**8.14 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ ප්‍රාග්ධන තත්ත්වය**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- ප්‍රාග්ධන මට්ටම වර්ධනය විය. ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවම ප්‍රාග්ධන අවශ්‍යතාව 2018 ජනවාරි 01 සිට රුපියල් බිලියන 1 දක්වා ද, 2019 ජනවාරි 01 දිනට රුපියල් බිලියන 1.5 දක්වා ද, 2020 ජනවාරි 01 දිනට රුපියල් බිලියන 2.0 දක්වා ද, 2021 ජනවාරි 01 දිනට රුපියල් බිලියන 2.5 දක්වා ද වශයෙන් ඉහළ දැමීම හේතුවෙන් සමස්ත නියාමන ප්‍රාග්ධන ප්‍රමාණයන් 2017 දෙසැම්බර් මස අවසානයේදී වාර්තා කළ ප්‍රමාණයට සාපේක්ෂව 2018 අගෝස්තු මස අවසානයට රුපියල් බිලියන 13.6 කින් වර්ධනය විය. මීට අමතරව, නව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා රාමුව යටතේ ණය අවදානම සහ මෙහෙයුම් අවදානම ආවරණය කරමින් වඩාත්

**8.15 රූප සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ වත්කම් මත ප්‍රතිලාභය සහ හිමිකම් මත ප්‍රතිලාභය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.2 සංඛ්‍යා සටහන**

**බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 අගෝ. අවසානයට | 2017 අගෝ. අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 අගෝ. අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2017 අගෝ. | 2018 අගෝ. (අ) |
| මුළු වත්කම් - ශුද්ධ (රු. බිලියන) | 1,140 | 1,307 | 1,355 | 1,406.4 | 14.7 | 7.6 |
| ණය සහ අත්තිකාරම් - ශුද්ධ (රු. බිලියන) | 900 | 1,020 | 1,057 | 1,125.0 | 13.4 | 10.3 |
| තැන්පතු (රු. බිලියන) | 506 | 636 | 687 | 693.9 | 25.6 | 9.2 |
| ණය ගැනීම් (රු. බිලියන) | 408 | 413 | 396 | 430.9 | 1.2 | 4.3 |
| ප්‍රාග්ධන අරමුදල් (රු. බිලියන) | 142 | 164 | 167 | 184.1 | 15.2 | 12.2 |
| පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 12.0 | 12.6 | 12.4 | 9.6 | | |
| මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය (%) | 12.6 | 13.3 | 13.1 | 11.1 | | |
| දළ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 5.5 | 5.5 | 5.9 | 6.9 | | |
| ශුද්ධ අක්‍රීය ණය අත්තිකාරම් අනුපාතය (%) | 1.3 | 1.3 | 1.6 | 2.2 | | |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පෙර) (%) - වාර්ෂික පදනම මත | 3.7 | 3.0 | 3.0 | 2.8 | | |
| හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (බදු පසු) (%) - වාර්ෂික පදනම මත | 20.0 | 14.9 | 14.7 | 12.9 | | |
| මුළු වත්කම්වලට ද්‍රවශීල වත්කම් අනුපාතය (%) | 7.0 | 8.5 | 8.9 | 7.5 | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අවදානම් සංවේදී ආකාරයෙන් අවදානම මත බර තැබූ වත්කම් වාර්තා කිරීමට සිදු වූ බැවින්, 2017 වසරේ දෙසැම්බර් මස අවසානයේදී මූලික ප්‍රාග්ධන අනුපාත හා අවදානම මත බර තැබූ සමස්ත ප්‍රාග්ධන අනුපාත වාර්තා කළ පිළිවෙළින් සියයට 12.4 සහ සියයට 13.1 සිට 2018 අගෝස්තු මස අවසානයේදී පිළිවෙළින් සියයට 9.6 සහ සියයට 11.1 දක්වා අඩු විය. කෙසේ වෙතත්, දුර්වල මූල්‍ය තත්ත්ව හේතුවෙන් අවශ්‍ය අවම මට්ටමට වඩා පහළින් පැවති සමාගම් කිහිපයක් පවතින අතර අදාළ සමාගම් විසින් එම ගැටලු නිවැරදි කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය වේ.

- **ප්‍රධාන වශයෙන්ම අරමුදල් සපයා ගැනීමේ පිරිවැය හා අක්‍රීය ණය ඉහළ යෑම හේතුවෙන් ලාභදායීත්වය අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරන ලදී.** 2017 පළමු මාස අට තුළදී බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය වාර්තා කළ රුපියල් බිලියන 17.6 ක ලාභයට සාපේක්ෂව 2018 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ ලාභය රුපියල් බිලියන 15.5 ක් ලෙස පැවතිණි. සලකා බලන කාලපරිච්ඡේදය තුළ මෙම අංශයේ ලාභය අඩු වීමට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ, අරමුදල් සපයා ගැනීමේ පිරිවැය ඉහළ යෑම සහ ණය අලාභ වෙන්කිරීම් වල ඉහළ යෑමය. වාර්ෂික වත්කම් මත ප්‍රතිලාභ සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාත පසුගිය වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළ පැවති පිළිවෙළින් සියයට 3.0 සහ සියයට 14.9 ට සාපේක්ෂව 2018 අගෝස්තු මස අවසානයේදී පිළිවෙළින් සියයට 2.8 ක් සහ සියයට 12.9 ක් විය.

## ප්‍රාථමික අලෙවිකරුවන්

- **ප්‍රාථමික අලෙවිකාර අංශයෙහි, සමස්ත වත්කම් සහ සමස්ත ආයෝජන කළඹ 2018 වසරේ පළමු මාස අට තුළදී අඩුවීමක් පෙන්නුම් කරන ලදී.** ප්‍රාථමික අලෙවිකාර අංශයෙහි සමස්ත වත්කම් රුපියල් බිලියන 359.4 දක්වා සියයට 16.1 කින් අඩු වූ අතර, රජයේ සුරැකුම්පත් වල සමස්ත ආයෝජන කළඹ රුපියල් බිලියන 348.2 දක්වා සියයට 11.6 කින් වසරේ පළමු මාස අට තුළදී පහත වැටුණි. ප්‍රාථමික අලෙවිකාර අංශයේ ආයෝජන කළඹෙහි සිදු වූ අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු විය. ප්‍රතිමිළදීගැනුම් යටතේ ණය ගැනීම් 2017 අගෝස්තු මස අවසානයේදී පැවති අගයට සාපේක්ෂව සියයට 118.8 කින් රුපියල් බිලියන 68.5 දක්වා 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී විශාල ලෙස අඩු විය.

- **වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය සහ හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය මඟින් ගණනය කරන ලද ප්‍රාථමික අලෙවිකාර අංශයෙහි ලාභදායීත්වය, 2018 අගෝස්තු මස අවසානයේදී පිළිවෙළින් සියයට 2.9 සහ සියයට 16.7 යන අගයන්හි පැවතිණි.** 2017 පළමු මාස අට අවසානයේදී පැවති ලාභය වූ රුපියල් බිලියන 10.2 ට සාපේක්ෂව සමස්ත ප්‍රාථමික අලෙවිකාර අංශය 2018 වසරේ සලකා බලන කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 8.9 ක ලාභයක් වාර්තා කරන ලදී. 2017 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලය තුළ ප්‍රාථමික අලෙවිකාර අංශය වාර්තා කළ රුපියල් බිලියන 3.0 ක සමස්ත ප්‍රතිලාභයන්ට (උපලබ්ධි වූ සහ උපලබ්ධි නොවූ) සාපේක්ෂව 2018 සලකා බලන කාලපරිච්ඡේදය තුළදී එම අගය රුපියල් බිලියන 1.2 ක් දක්වා ශීඝ්‍ර අඩුවීමක් වාර්තා කරන ලදී. 2017 ජූලි 6

8

**8.3 සංඛ්‍යා සටහන**

**ප්‍රාථමික අලෙවිකරුවන්ගේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 අගෝ. අවසානයට | 2017 අගෝ. අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 අගෝ. අවසානයට (අ)(ආ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2017 අගෝ. | 2018 අගෝ. (අ)(ආ) |
| **මුළු වත්කම් (රු. බිලියන)** | **311.8** | **418.3** | **337.2** | **359.4** | **34.2** | **-14.1** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 87.5 | 67.6 | 77.3 | 73.9 | -22.7 | 9.2 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 224.4 | 350.7 | 259.9 | 285.5 | 56.3 | -18.6 |
| **සමස්ත කළඹ (රු. බිලියන)** | **256.0** | **393.8** | **314.2** | **348.2** | **53.2** | **-11.6** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 41.3 | 50.6 | 62.6 | 67.3 | 22.4 | 33.0 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 214.6 | 343.2 | 251.6 | 280.9 | 59.9 | -18.2 |
| **මුළු ප්‍රාග්ධනය (රු. බිලියන) (ඇ)** | 19.5 | 23.2 | 23.1 | 11.9 | 19.3 | -48.6 |
| **බදු පෙර ලාභය (රු. බිලියන) (ඈ)** | **11.1** | **10.2** | **15.1** | **8.9** | **-7.7** | **-12.7** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 7.4 | 2.3 | 3.1 | 1.4 | -69.2 | -37.6 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 3.7 | 8.0 | 11.9 | 7.5 | 114.8 | -5.6 |
| **පළමු පෙළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය(%) (ඇ)** | 33.7 | 57.4 | 54.9 | 21.5 | 23.7 | -35.9 |
| **මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ඇ)** | 35.0 | 58.8 | 55.9 | 22.3 | 23.8 | -36.5 |
| **වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (%)** | 5.7 | 3.9 | 4.0 | 3.9 | -1.8 | - |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 13.3 | 4.6 | 4.2 | 2.9 | -8.7 | -1.4 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 2.7 | 3.8 | 3.9 | 4.2 | 1.1 | 0.4 |
| **හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය (%) (ඇ)** | 66.1 | 16.9 | 14.9 | 16.7 | -49.2 | -0.2 |
| **තෝලන කාලය (ඇ)** | 3.5 | 1.9 | 2.3 | 5.1 | -1.6 | 3.2 |
| **මෙහෙයුමේ පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (ඈ)** | **6.4** | **7.7** | **7.9** | **7.7** | **1.3** | **-** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 8.3 | 24.8 | 26.8 | 30.8 | 16.5 | 6.0 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 2.5 | 1.4 | 1.3 | 1.4 | -1.1 | - |
| **මුළු පිරිවැය මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස (ඈ)** | **54.1** | **64.0** | **63.2** | **59.4** | **9.9** | **- 4.6** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 36.5 | 64.0 | 64.9 | 73.8 | 27.5 | 9.8 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 71.5 | 64.1 | 62.7 | 59.4 | -7.4 | - 4.7 |
| **වත්කම් සහ වගකීම් අතර වෙනස (වසර)** | **1.3** | **1.0** | **1.0** | **2.4** | **-23.1** | **140.0** |
| බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක | 3.0 | 2.4 | 1.9 | 5.7 | -20.0 | 136.7 |
| බැංකු ප්‍රාථමික අලෙවිකාර ඒකක | 0.6 | 0.4 | 0.3 | 0.4 | -33.3 | - |

(අ) තාවකාලික

(ආ) මෙම දත්ත තුළ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් හි මූල්‍ය දත්ත අඩංගු නොවේ.

(ඇ) බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක පමණි.

(ඈ) කාලපරිච්ඡේදය තුළ

සටහන: ඉහත දත්ත තුළ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී එල් සී හි මූල්‍ය දත්ත අඩංගු නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

වන දින පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් ආයතනයේ ව්‍යාපාර කටයුතු අත්හිටුවීම සමස්ත අංශය කෙරෙහි ඍණාත්මක බලපෑමක් ඇතිකිරීමට හේතු විය.

- **ප්‍රාග්ධනය හිතකර මට්ටම්වල පවත්වා ගන්නා ලදී.** 2018 අගෝස්තු අවසානය වන විට සියළු බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්[1] සිය ප්‍රාග්ධන මට්ටම් අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය වන රුපියල් මිලියන 1,000 ට වඩා ඉහළ අගයන්හි පවත්වා ගන්නා ලදී. ප්‍රාථමික අලෙවිකාර අංශයේ බර තබන ලද ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතිකය එහි අවම අගය වන සියයට 10.0 ට වඩා වැඩි අගයක පවත්වාගත් අතර 2017 අගෝස්තු අවසානය වන විට පැවති සියයට 58.8 ට සාපේක්ෂව සිට 2018 එම කාලපරිච්ඡේදය තුළදී සියයට 22.3 ක් දක්වා අඩුවිය.

- **අවදානම් ව්‍යුහය යහපත් විය.** අලෙවිය සඳහා පැවති කළඹ සමස්ත ආයෝජන කළඹට දරන අනුපාතය, 2017 අගෝස්තු මස අවසානයේදී පැවති සියයට 33.8 සිට 2018 අගෝස්තු මස අවසානයේදී සියයට 42.8 දක්වා වැඩි විය. වෙළඳපොළ අවදානම සඳහා නිරාවරණය අඩු විය. ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රඳවාගන්නා අවදානම් රහිත රජයේ සුරැකුම්පත් විශාල ප්‍රමාණය සහ අනපේක්ෂිත ද්‍රවශීලතා පරතර පියවා ගැනීම සඳහා එම රජයේ සුරැකුම්පත් සුරැකුමක් ලෙස භාවිතා කිරීමට ඔවුන්ට ඇති හැකියාව සැලකීමේදී ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ද්‍රවශීලතා අවදානම් පැතිකඩ අඩු අගයක පැවතිණි. තවද, යම් ද්‍රවශීලතා පරතරයක් ඇති වුවහොත් එය පියවා ගැනීම සඳහා අනපේක්ෂිත මූල්‍ය අවශ්‍යතා සඳහා සැලසුම් බොහෝ ප්‍රාථමික අලෙවිකරුවන් සතුව පැවතිණි.

## රක්ෂණ අංශය

- **සමස්ත වත්කම් සහ වාරික ආදායම සැලකිල්ලට ගත් විට රක්ෂණ අංශය අඛණ්ඩව වර්ධනය විය.** 2017 වසරේ ජූනි මස අවසානයේදී වාර්තා කළ සියයට

1 පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් සහ එන්ට්‍රස්ට් සෙකියුරිටීස් පී.එල්.සී. හැර බැංකු නොවන ප්‍රාථමික අලෙවිකාර ඒකක.

### 8.4 සංඛ්‍යා සටහන
### රක්ෂණ අංශයේ තෝරාගත් දර්ශක

| අයිතම | 2016 ජූනි අවසානයට | 2017 ජූනි අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % | |
|---|---|---|---|---|---|---|
| | | | | | 2017 ජූනි | 2018 ජූනි (අ) |
| **මුළු වත්කම් (රු. බිලියන)** | **478.4** | **533.1** | **559.2** | **581.8** | **11.4** | **9.1** |
| **මුළු ආදායම (රු. බිලියන) (ආ)** | **82.1** | **96.6** | **201.6** | **108.1** | **17.7** | **11.8** |
| දළ වාරික ආදායම (රු. බිලියන) (ආ) | 66.8 | 76.2 | 160.4 | 85.8 | 14.0 | 12.6 |
| ආයෝජන ආදායම (රු. බිලියන) (ආ) | 15.3 | 20.5 | 41.1 | 22.3 | 33.9 | 8.9 |
| **බදු පෙර ලාභය (රු. බිලියන) (ආ)** | **5.2** | **4.7** | **24.7** | **21.7** | **-10.0** | **364.7** |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය (%) (ඇ) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 296.0 | 358.0 | 336.0 | 310.3 | | |
| සාමාන්‍ය රක්ෂණය | 166.0 | 117.0 | 175.7 | 179.5 | | |
| රඳවා ගැනීමේ අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 96.2 | 95.9 | 95.9 | 96.0 | | |
| සාමාන්‍ය රක්ෂණය | 159.1 | 78.5 | 77.9 | 76.1 | | |
| හිමිකම් අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 37.1 | 36.9 | 29.8 | 44.2 | | |
| සාමාන්‍ය රක්ෂණය | 55.7 | 63.9 | 64.3 | 63.7 | | |
| ඒකාබද්ධ මෙහෙයුම් අනුපාතය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 85.1 | 86.2 | 80.0 | 98.0 | | |
| සාමාන්‍ය රක්ෂණය | 97.2 | 102.9 | 102.7 | 101.4 | | |
| වත්කම් මත ප්‍රතිලාභය (%) | | | | | | |
| දිගු කාලීන රක්ෂණය | 2.2 | 1.8 | 4.5 | 8.5 | | |
| සාමාන්‍ය රක්ෂණය | 2.4 | 8.9 | 4.7 | 5.1 | | |
| **හිමිකම් මත ප්‍රතිලාභය (%) - සාමාන්‍ය රක්ෂණය** | **4.5** | **18.8** | **9.9** | **10.4** | | |
| **ප්‍රාරක්ෂණ අනුපාතය (%) - සාමාන්‍ය රක්ෂණය** | **15.7** | **17.1** | **17.4** | **18.0** | | |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ
(ඇ) නුබුන්වත් ආන්තික අනුපාතය වෙනුවට 2016 වසරේ සිට හඳුන්වාදෙන ලදී.

මූලය: ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව

11.4 ක වර්ධනයට සාපේක්ෂව රක්ෂණ අංශයේ සමස්ත වත්කම් 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 9.1 කින් වර්ධනය විය. රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික ආදායම 2017 වසරේ ජූනි මස වාර්තා කළ සියයට 14.0 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එම වර්ධනය සියයට 12.6 ක් දක්වා සුළු වශයෙන් අඩුවිය. දළ ලියාහළ ආදායමෙහි සිදු වූ මෙම සමස්ත වර්ධනයට සාමාන්‍ය රක්ෂණ අංශය හා දිගුකාලීන රක්ෂණ අංශය යන අංශ දෙකම එක හා සමානව දායකත්වය සැපයීය. සාමාන්‍ය රක්ෂණ අංශයේ දළ ලියාහළ වාරික ආදායම සඳහා සියයට 64.4 ක දායකත්වයක් සපයන රථවාහන රක්ෂණය, 2017 වසරේ පළමු භාගය තුළ වාර්තා කළ සියයට 15.8 ක වර්ධනයට සාපේක්ෂව 2018 වසරේදී අනුරූප කාල පරිච්ඡේදයේදී සියයට 14.4 කින් වර්ධනය විය. ගිනි රක්ෂණය 2017 වසරේ ජූනි මස අවසානයේදී වාර්තා කළ සියයට 11.0 ක වර්ධනය හා සැසඳීමේදී 2018 වසරේදී එය සියයට 16.6 ක ඉහළ වර්ධනයක් පෙන්වීය. කෙසේ වුවද, මුහුදු රක්ෂණයෙහි හා සෞඛ්‍ය රක්ෂණයෙහි වර්ධනය 2018 වසරේදී පිළිවෙළින් සියයට 3.9 ක් හා සියයට 10.6 ක් දක්වා පහත වැටුණු අතර, 2017 වසරේදී එය පිළිවෙළින් සියයට 7.3 ක් හා සියයට 15.8 ක් විය.

- **2018 වසරේ පළමු භාගය තුළදී, රක්ෂණ අංශයෙහි සමස්ත ලාභයෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබිණ.** රක්ෂණ අංශයේ සමස්ත බදු පෙර ලාභය 2017 වසරේ දෙවන භාගය තුළදී සියයට 10.0 ක පහත වැටීමක් වාර්තා වුවද, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 364.7 ක සැලකිය යුතු ඉහළ වර්ධනයක් වාර්තා කරන ලදී. දිගු කාලීන රක්ෂණ අංශයේ බදු පෙර ලාභය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී දක්වන ලද සියයට 78.5 ක පහත වැටීමට සාපේක්ෂව 2018 වසරේදී වාර්තා කරන ලද සියයට 2,246.6 ක සැලකිය යුතු ඉහළ වර්ධනය, රක්ෂණ අංශයෙහි සමස්ත බදු පෙර ලාභයෙහි මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. ලාභදායීත්වයේ මෙම අසාමාන්‍ය වර්ධනය රක්ෂණ සමාගම් දෙකක් විසින් සිදු කරන ලද අතිරික්ත හුවමාරු කිරීම්වල ප්‍රතිඵලයක් විය. ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ රෙගුලාසිවලට අනුකූලව, ජීවිත රක්ෂණ හිමියන්ගේ වගකීම් තක්සේරු කිරීමේ ක්‍රමවේදයට සිදු කරන ලද වෙනස් කිරීම් තුළින් මෙම අතිරික්තය නිර්මාණය වී ඇත. රක්ෂණ අංශයෙහි හිමිකම් පෑම් සලකා බැලීමේදී, සාමාන්‍ය රක්ෂණ අංශයේ හා දිගුකාලීන රක්ෂණ අංශයේ හිමිකම් පෑම්, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී පිළිවෙළින් සියයට 10.2 කින් සහ සියයට 34.3 කින් ඉහළ ගියේය. රක්ෂණ සමාගම්වල ආයෝජන ආදායම 2017 වසරේ පළමු

8

**8.5 සංඛ්‍යා සටහන**
**ඒකක භාර අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 ජූනි අවසානයට | 2017 ජූනි අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % 2017 ජූනි | 2018 ජූනි (අ) |
|---|---|---|---|---|---|---|
| සමස්ත වත්කම් (රු. බිලියන) | 127.7 | 104.3 | 128.8 | 64.8 | -18.3 | -37.9 |
| ශුද්ධ වත්කම් වටිනාකම (රු. බිලියන) | 126.8 | 103.3 | 128.8 | 64.6 | -18.5 | -37.5 |
| ආයෝජන (රු. බිලියන) | 122.8 | 102.3 | 127.7 | 64.8 | -16.7 | -36.7 |
| කොටස්වල | 12.6 | 14.4 | 13.0 | 11.1 | 13.9 | -22.8 |
| රජයේ සුරැකුම්පත්වල | 55.9 | 42.8 | 22.5 | 5.3 | -23.4 | -87.6 |
| වෙනත් (උදා: වාණිජ පත්‍ර, ණයකර, භාරකාර සහතික පත්‍ර සහ බැංකු තැන්පතු) | 54.4 | 45.2 | 92.1 | 48.4 | -16.8 | 7.1 |
| කොටස්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 9.9 | 13.9 | 10.2 | 17.2 | | |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජනය ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 43.7 | 41.0 | 17.7 | 8.2 | | |
| වෙනත් ආයෝජනයන් ශුද්ධ වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 42.9 | 43.8 | 72.2 | 74.9 | | |
| මුළු ඒකක හිමිකරුවන්ගේ සංඛ්‍යාව | 39,707 | 40,651 | 41,037 | 41,200 | | |
| ඒකක නිකුතුන් ගණන (බිලියන) | 8.9 | 6.7 | 7.6 | 2.0 | | |
| ඒකක භාර සංඛ්‍යාව | 76 | 76 | 79 | 79 | | |

(අ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා ඒකක භාර සංගමය

භාගයේදී සියයට 33.9 කින් වර්ධනය වූ අතර, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී එය සියයට 8.9 ක් විය. දිගුකාලීන රක්ෂණ අංශයේ සහ සාමාන්‍ය රක්ෂණ අංශයේ සමස්ත ආයෝජන ප්‍රමාණයෙන් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන පිළිවෙළින් සියයට 47.5 ක් සහ සියයට 38.0 ක් විය.

## ඒකක භාර අංශය

- **ශුද්ධ වත්කම් වටිනාකම පිළිබඳව සලකා බැලීමේදී 2018 වසරේ පළමු භාගය තුළ දී ඒකක භාර අංශයේ පසුබෑමක් වාර්තා විය.** සමස්ත ඒකක හිමිකරුවන් ගණන වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 1.4 ක සුළු වර්ධනයක් වූ අතර, ඒකක භාර ගණන 3 කින් ඉහළ ගියේය. ඒකක භාර අංශයේ ශුද්ධ වත්කම් වටිනාකම 2017 වසරේදී අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 ජූනි මස අවසානයේදී සියයට 37.5 කින් රුපියල් බිලියන 64.6 ක් දක්වා පහත වැටිණි. ඒකක භාරවල ආයෝජන කළඹෙන් කොටස් වෙළඳ පොළෙහි සිදු කරන ලද ආයෝජන ප්‍රමාණය සියයට 22.8 කින් පහත වැටුණු අතර, රජයේ සුරැකුම්පත්වල සිදු කරන ලද ආයෝජන සියයට 87.6 කින් සැලකිය යුතු ලෙස පහත වැටුණි.

## කොටස් තැරැව්කාර සමාගම් අංශය

- **2018 වසරේ පළමු භාගය තුළදී, කොටස් තැරැව්කාර සමාගම් අංශය සෘණාත්මක කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී.** කොටස් තැරැව්කාර අංශයේ ආදායම 2017 වසරේ පළමු භාගයේ වාර්තා වූ රුපියල් මිලියන 447.2 හා සසඳන කල 2018 වසරේ පළමු භාගය තුළදී, රුපියල් මිලියන 384.6 ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 14.0 කින් පහත වැටිණි. කොටස් තැරැව්කාර අංශය 2017 වසරේ වාර්තා කරන ලද රුපියල් මිලියන 35.3 ක ලාභය හා සැසඳීමේදී 2018 වසරේදී වාර්තා කළ ශුද්ධ ලාභය සියයට 77.0 කින් පහළ යමින් රුපියල් මිලියන 57.9 ක අලාභයක් වාර්තා කරන ලදී. එසේම, සමස්ත වත්කම් 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සසඳන කල සියයට 18.4 කින් පහත වැටිණි. කොටස් තැරැව්කාර අංශයෙහි ප්‍රාග්ධනය, 2017 වසරේ ජූනි මස වාර්තා කළ රුපියල් මිලියන 5,552.0 ක සිට 2018 ජූනි මසදී රුපියල් මිලියන 5,495.0 ක් දක්වා සියයට 1.0 කින් සුළු වශයෙන් පහත වැටිණි. මෙම කාලපරිච්ඡේදය තුළ ප්‍රාග්ධන වෙළඳපොළෙහි දක්නට ලැබුණු පසුබෑමට සමගාමීව කොටස් තැරැව්කාර සමාගම් අංශයෙහි

**8.6 සංඛ්‍යා සටහන**
**කොටස් තැරැව්කාර සමාගම් අංශයේ තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 ජූනි අවසානයට | 2017 ජූනි අවසානයට | 2017 දෙසැ. අවසානයට | 2018 ජූනි අවසානයට (අ) | ලක්ෂ්‍යමය වෙනස % 2017 ජූනි | 2018 ජූනි (අ) |
|---|---|---|---|---|---|---|
| මුළු වත්කම් (රු. බිලියන) | 9.5 | 12.8 | 9.1 | 10.5 | 34.4 | -18.4 |
| හිමිකම් හැර මුළු වගකීම් (රු. බිලියන) | 3.9 | 7.3 | 3.2 | 5.0 | 87.5 | -31.7 |
| ශුද්ධ ප්‍රාග්ධනය (රු. බිලියන) | 4.5 | 5.6 | 5.8 | 5.5 | 22.6 | -1.0 |
| ආදායම (රු. බිලියන) (ආ) | 0.4 | 0.4 | 2.0 | 0.4 | 10.1 | -14.0 |
| බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය) (රු. මිලියන) (ආ) | -121.0 | 35.3 | 74.0 | -57.9 | -129.2 | -77.0 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව

8

මන්දගාමී කාර්යසාධනයක් වාර්තා විය. මේ අතර, 2017 ජුනි මස 30 වන දිනට ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගින් හඳුන්වා දෙන ලද නව නියාමන අවශ්‍යතාව සපුරාලීමට එක් සමාගමක් අපොහොසත් විය.

## විශ්‍රාම අරමුදල්

- **ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම අරමුදල වන සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ.) වත්කම් පදනම, 2018 වසරේ ජුනි මස අවසානය වන විට රුපියල් ට්‍රිලියන 2.2 ඉක්මවිය.** සේ.අ.අ. හි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය 2017 වසරේ දෙසැම්බර් මස වනවිට පෙර වසරට සාපේක්ෂව සියයට 4.1 කින් වැඩි වී මිලියන 18.0 කට ළඟා විය.

- **පසුගිය වසරේ පළමු භාගය සමඟ සසඳන කල 2018 වසරේ පළමු භාගය තුළදී සමස්ත දායක මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 70.7 ක් දක්වා සියයට 8.8 කින් වර්ධනය වූ අතර, ප්‍රතිලාභ ආපසු ගෙවීම් රුපියල් බිලියන 51.1 ක් දක්වා සියයට 19.7 කින් අඩු විය.** 2018 වසරේදී වාර්තා කළ ශුද්ධ දායකත්ව මුදල් ප්‍රමාණය (දායකත්ව මුදලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) රුපියල් බිලියන 19.7 ක් වූ අතර, එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී රුපියල් බිලියන 1.5 ක් විය.

- **2018 වසරේ ජුනි 30 දිනෙන් අවසන් වන මාස 12 ක කාලපරිච්ඡේදය තුළ සේ.අ.අ.හි සමස්ත ආයෝජන කළඹ රුපියල් බිලියන 2,107 ක් දක්වා සියයට 12.5 කින් වර්ධනය වූ අතර, ඒ අනුව සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 2,169 ක් දක්වා සියයට 11.3 කින් වර්ධනය විය.** සේ.අ.අ. හි ආයෝජන කළඹෙන් සියයට 91.8 ක් රාජ්‍ය සුරකුම්පත් වලින් ද සියයට 3.8 ක් ව්‍යාපාර කොටස්වලින් ද සියයට 2.2 ක් සාංගමික ණය උපකරණ, භාරකාර සහතිකපත්, ප්‍රතිවිකුණුම්වලින් සමන්විත වූ අතර, සියයට 2.2 ක් ස්ථාවර තැන්පතු වලින් ද සමන්විත විය. 2018 වසරේ පළමු භාගය තුළදී අරමුදලෙහි දළ ආයෝජන ආදායම රුපියල් බිලියන 110.8 ක් ලෙස වාර්තා වූ අතර, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය සමඟ සසඳන කල මෙය සියයට 2.2 ක වර්ධනයකි.

- **සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමස්ත සාමාජික ගිණුම් ප්‍රමාණය 2017 ජුනි මස අවසානයේ පැවති මිලියන 12.5 ක සිට 2018 ජුනි මස අවසානය වන විට මිලියන 12.6 ක් දක්වා වැඩි විය.** කෙසේ වුවද, සක්‍රීය ගිණුම් මිලියන 2.6 ක් පමණක් පැවතිණි. 2018 ජුනි මස අවසානයේදී සමස්ත දායකත්වය රුපියල් බිලියන 12.3 කින්, එනම් වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 10.4 කින් වැඩි විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 9.4 කින් එනම් සියයට 0.2 කින් සුළු වශයෙන් වැඩිවීමෙහි ප්‍රතිඵලයක් ලෙස රුපියල් බිලියන 2.9 ක ඉහළ ශුද්ධ දායකත්වයක් වාර්තා විය. තවද, 2018 ජුනි මස අවසානයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි සමස්ත වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 295.0 ක් දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 12.4 කින් වැඩි විය. 2018 වසරේ ජුනි මස අවසානයේදී සේවා නියුක්තයන්ගේ භාර අරමුදලෙහි ආයෝජන කළඹෙන් සියයට 72.3 ක් රාජ්‍ය සුරකුම්පත් වලින් සමන්විත විය. 2018 ජුනි මස අවසානය වන විට ව්‍යාපාර කොටස්, ඒකක භාර, සාංගමික ණය සුරකුම්පත් සහ අනෙකුත් ආයෝජන පිළිවෙළින් සියයට 3.8 ක්, සියයට 0.1 ක්, සියයට 0.9 ක් සහ සියයට 22.8 ක් විය.

- **රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල සක්‍රීය සාමාජිකයින් 228,700 කින් සමන්විත විය.** 2017 පළමු භාගයේදී වාර්තා වූ රුපියල් මිලියන 640.1 ට සාපේක්ෂව 2018

**8.7 සංඛ්‍යා සටහන**

**විශ්‍රාම අරමුදල්වල තෝරාගත් දර්ශක**

| අයිතම | සේවක අර්ථසාධක අරමුදල | | | සේවා නියුක්තයන්ගේ භාර අරමුදල | | |
|---|---|---|---|---|---|---|
| | 2017 ජුනි අවසානයට | 2018 ජුනි අවසානයට (අ) | වෙනස (%) (අ) | 2017 ජුනි අවසානයට | 2018 ජුනි අවසානයට (අ) | වෙනස (%) (අ) |
| මුළු දායකත්වය (රු.බිලියන) (ආ) | 65.0 | 70.7 | 8.8 | 11.1 | 12.3 | 10.4 |
| මුළු ප්‍රතිලාභ ගෙවීම් (රු.බිලියන) (ආ) | 63.6 | 51.1 | -19.7 | 9.4 | 9.4 | 0.2 |
| මුළු වත්කම් (රු.බිලියන) | 1,948 | 2,169 | 11.3 | 262.4 | 295.0 | 12.4 |
| මුළු ආයෝජන කළඹ (රු.බිලියන) | 1,873 | 2,107 | 12.5 | 246.8 | 287.9 | 16.6 |
| එයින් රජයේ සුරකුම්පත් (%) | 91.6 | 91.8 | 0.2 | 84.4 | 72.3 | -14.2 |
| දළ ආදායම (රු.බිලියන) (ආ) | 108.4 | 110.8 | 2.2 | 13.6 | 14.5 | 6.1 |

(අ) තාවකාලික
(ආ) කාලපරිච්ඡේදය තුළ

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

පළමු භාගය තුළදී අරමුදලෙහි ශුද්ධ ආයකත්වය රුපියල් මිලියන 50.9 ක් දක්වා සැලකිය යුතු ලෙස පහත වැටිණි. කෙසේ වුවද, අරමුදලෙහි වත්කම් පදනම වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 28.8 කින් ඉහළ ගිය අතර, එය රුපියල් බිලියන 64.2 ක පැවතිණි. තවද, රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලෙහි ආයෝජන 2017 ජූනි මස අවසානය වන විට වාර්තා කළ රුපියල් බිලියන 47.8 ට සාපේක්ෂව 2018 ජූනි මස අවසානය වන විට රුපියල් බිලියන 62.7 ක් දක්වා වර්ධනය විය. සමස්ත ආයෝජන වලින් රාජ්‍ය සුරැකුම්පත් වල සිදු කළ ආයෝජන 2017 ජූනි මස අවසානය වන විට වාර්තා කළ සියයට 96.3 ක සිට 2018 ජූනි මස අවසානයේදී සියයට 66.8 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු විය. මෙම කාලපරිච්ඡේදය තුළදී සාමාජික ශේෂයන් මත ඉපැයුම් අනුපාතිකය සියයට 13.0 ක් විය.

- **2018 ජූනි මස අවසානයේදී සාමාජිකයින් 169,201 කින් සමන්විත පෞද්ගලික කළමණාකාරීත්වයකින් යුතු අනුමත විශ්‍රාම අරමුදල් 127 ක් විය.** 2018 ජූනි මස අවසානයේදී අනුමත විශ්‍රාම අරමුදල් වල සමස්ත වත්කම් සහ ආයෝජන පිළිවෙළින් රුපියල් බිලියන 179.7 ක් හා රුපියල් බිලියන 163.8 ක් ව පැවතුණි.


## මූල්‍ය වෙළඳපොළ සංවර්ධනයන්

### අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළඳපොළ

- **2018 සැප්තැම්බර් මස අග දක්වා වසරේ වැඩි කාලයක බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකයෙන් සමන්විත පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය සීමාවෙහි පැවතුණි.** 2017 දෙසැම්බර් අවසානයේ සියයට 8.15 ක් ලෙස පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව හේතුකොට ගෙන 2018 මාර්තු අවසානය වන විට ද එම මට්ටම ආසන්නයේ පැවතුණි. රාජ්‍ය සුරැකුම්පත් ගනුදෙනු මත පනවා තිබූ මතිමාත්‍ර බදු බැර හේතුවෙන් ඒක්ෂණ හා ප්‍රතිමිලදීගැනුම් වෙළඳපොළ පොලී අනුපාතික තුළ තිබූ විෂමතාවන් 2018 අප්‍රේල් 2 දින නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක වීමත් සමඟ ඉවත් විය. කෙසේ වෙතත්, මෙමගින් ඇතිවූ අවිනිශ්චිතතා, වෙළඳපොළෙහි දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මාර්තු අවසානයේ සියයට 8.14 ක් ලෙස පැවති බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, පසු දින පදනම් අංක 26 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, එම අනුපාතිකය ඉන් පසු දින කිහිපයක් පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාවෙහි පැවතුණ අතර, පසුව පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය සීමාව දක්වා පහළ වැටුණි. 2018 අප්‍රේල් 4 වන දින නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 දක්වා පදනම් අංක 25 කින් අඩු කිරීම හරහා මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ රජය සමඟ පැවති ගනුදෙනු හේතුවෙන් ද්‍රවශීලතාව ඉහළ යෑම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඩු වීමට බලපෑවේය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීම තුළින් මතු වූ ද්‍රවශීලතා හිඟයට ප්‍රතිචාර දක්වමින් 2018 ජූනි මස පළමු සතියෙහි බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව වෙත ගමන් කරන ලදී. කෙසේ වෙතත්, රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සිදු කළ ගනුදෙනු හේතුවෙන් 2018 ජූලි මස අවසානයේ සිට සැප්තැම්බර් මස මැද දක්වා දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත ද්‍රවශීලතාව නිසා බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ක්‍රමයෙන් අඩු වූ අතර, ඉන් පසුව පොලී අනුපාතික කොරිඩෝවෙහි මධ්‍ය අනුපාතිකය ආසන්නයේ පැවතුණි. ඉන් පසුව, රජය සමඟ සිදුකළ ගනුදෙනු සහ වාණිජ බැංකු සමඟ සිදු කළ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පරිණත වීම නිසා 2018 සැප්තැම්බර් මස මැද සිට ද්‍රවශීලතාවය අඩුවීම හේතුකොට ගෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල්

**8.16 රූප සටහන**

**නිත්‍ය අනුපාතික කොරිඩෝව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ වෙළඳපොළ ද්‍රවශීලතාව**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුපාතිකය, පොලී අනුපාතික කොරිඩෝවෙහි ඉහළ සීමාව දක්වා ගමන් කළේය. 2018 ඔක්තෝබර් 3 දින බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සියයට 8.44 ක් ලෙස පැවතිණි.


- **2018 මැයි මස අවසානයේ දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති අතිරික්ත රුපියල් ද්‍රවශීලතාව ඉන්පසුව හිඟයක් බවට පත්වී 2018 ජූලි මස මැද භාගයේ දී නැවත අතිරික්තයක් බවට පත්විය.** කෙසේ වෙතත්, 2018 සැප්තැම්බර් මස මැද භාගයේ සිට දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව අඩු වූ අතර, ඉන් පසුව ද්‍රවශීලතා හිඟයක් ලෙස පැවතුණි. ශ්‍රී ලංකා මහ බැංකුව, රජයට ලබා දී ඇති තාවකාලික අත්තිකාරම් හේතුවෙන්, 2017 වසරේ අවසානයේ පැවති රුපියල් බිලියන 18.3 ක අතිරික්ත ද්‍රවශීලතාව 2018 ජනවාරි ආරම්භයේ දී රුපියල් බිලියන 45.6 ක් දක්වා ශීඝ්‍රයෙන් වැඩි විය. ශ්‍රී ලංකා මහ බැංකුව භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම හේතුවෙන්, දේශීය මුදල් වෙළඳපොළෙහි පැවති රුපියල් ද්‍රවශීලතාව දිගින් දිගටම අතිරික්තයක් ලෙස පැවතුණි. කෙසේ වෙතත්, අප්‍රේල් මැද දක්වා වූ සති හයක කාලසීමාව තුළ, වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ගිණුම් වලින් මුදල් ආපසු ගැනීම් නිසා පමණක් ද්‍රවශීලතාව රුපියල් බිලියන 116.0 කට වඩා අඩු විය. මේ අතර, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අපේක්ෂිත මට්ටමේ පවත්වා ගනිමින් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතාව අවශෝෂණය කරගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික, කෙටි කාලීන සහ දිගු කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. විදේශ විනිමය හුවමාරු ගිවිසුම් පරිණත වීම සහ ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් විශ්‍රාම ගැන්වීම හේතුවෙන් 2018 මැයි අවසානය වන විට ද්‍රවශීලතා හිඟයක් බවට පත් විය. වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික, කෙටි කාලීන සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි මෙන්ම ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේ වෙන්දේසිද පවත්වන ලදී. රජය, ශ්‍රී ලංකා මහ බැංකුව සමග පැවැත්වූ විදේශ විනිමය ආශ්‍රිත ගනුදෙනු හේතුවෙන් ජූලි මස මැද වන විට ද්‍රවශීලතාව ඉහළ යන ලදී. කෙසේ වෙතත්, රජය සිදුකළ ඉදිරි වෙළඳ ගනුදෙනු ප්‍රතිවර්තන කිරීම සහ විදේශ විනිමය හුවමාරු ගනුදෙනු පරිණත වීම හේතුවෙන් 2018 සැප්තැම්බර් මස මැද වන විට දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව නැවත හිඟයක් බවට පත් විය. එම නිසා, තාවකාලික පදනම මත දේශීය මුදල් වෙළඳපොළට ද්‍රවශීලතාව ලබා දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනික, කෙටි කාලීන සහ දිගු කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වූ අතර, ස්ථිර පදනම මත ද්‍රවශීලතාව ලබා දීම සඳහා ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමේ වෙන්දේසිද පවත්වන ලදී. මේ අනුව, 2018 ඔක්තෝබර් මස 3 වන දින දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව රුපියල් බිලියන 35.6 ක හිඟයක් ලෙස පැවතිණි.

## දේශීය විදේශ විනිමය වෙළඳපොළ

- **2017 වසර අවසානයේ එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි අගය 152.85 ක් වූ අතර, 2018 වසරේ පළමු මාස නවය අවසානයේදී එම අගය රුපියල් 169.24 දක්වා සියයට 9.7 කින් අවප්‍රමාණය විය.** වසරේ මුල් මාස තුන තුළ රුපියලේ අගය සාමාන්‍යයෙන් ස්ථාවරව පැවති අතර, වෙළඳපොළෙන් විදේශ විනිමය අවශෝෂණය කිරීමටද මහ බැංකුව කටයුතු කරන ලදී. කෙසේ වුවද, ඛනිජ තෙල්, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ වාහන ආනයන ඉල්ලුම වැඩිවීම සහ අපනයන හරහා ලැබෙන විදේශ විනිමය රුපියල් බවට හැරවීමේදී අපනයනකරුවන් දක්වන උදාසීනත්වය හේතු කොටගෙන එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා මුදල් ඒකකය මත ඇති වූ පීඩනය හමුවේ, 2018 අප්‍රේල් අවසානයේ සිට මෙම උපනතිය වෙනස් විය. එක්සත් ජනපද සංචිත බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ දැමීමත් සමඟ රජයේ සුරැකුම්පත් සහ දේශීය කොටස් වෙළඳපොළ තුළ සිදු කර තිබූ විදේශ ආයෝජන ඉවත් කරගැනීම හමුවේ, මැයි, ජූනි, ජූලි සහ සැප්තැම්බර් මාස තුළදී, ශ්‍රී ලංකා රුපියල මත ඇති වූ පීඩනය තවදුරටත් තීව්‍ර වීමක් දක්නට ලැබුණි. තවද, වසරේ පළමු මාස නවය තුළ

**8.17 රූප සටහන**

**එ.ජ. ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියලෙහි විචලනය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

ශ්‍රී ලංකා රුපියල ජපන් යෙන්, ස්ටර්ලිං පවුම් සහ යූරෝ ආදී ප්‍රධාන මුදල් ඒකක හමුවේ අවප්‍රමාණය වීමක් දක්නට ලැබුණි. 2017 වසරේ දී ශ්‍රී ලංකා රුපියල ඉන්දියානු රුපියල හමුවේ අවප්‍රමාණය වීමක් පෙන්වුවද, 2018 වසරේ ගෙවී ගිය මාස නවයක කාලය තුළ ඉන්දියානු රුපියල ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලට වඩා අධික ලෙස අවප්‍රමාණය වීම හේතු කොටගෙන ශ්‍රී ලංකා රුපියල ඉන්දියානු මුදල් ඒකකයට සාපේක්ෂව අධිප්‍රමාණය විය.

- **2018 වසරේ ගෙවී ගිය පළමු මාස නවය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළඳපොළ තුළ ශුද්ධ විදේශ විනිමය විකුණුම්කරුවෙකු ලෙස ක්‍රියා කරන ලදී.** කෙසේ වුවද, වසරේ පළමු මාස හතර තුළ හිතකර වෙළඳපොළ තත්ත්ව හමුවේ සිදු කරන ලද අඛණ්ඩ විදේශ විනිමය මිලදී ගැනීම්, විදේශ සංචිත ඉහළ නංවා ගැනීමට ඉවහල් විය. කෙසේ නමුත්, ඊළඟ මාස පහ තුළදී විදේශ විනිමය විකුණුම් හරහා විනිමය අනුපාතිකයේ වූ අධික විචලන පාලනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරන ලදී. ඒ අනුව, සැප්තැම්බර් මස අවසානය වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ. ඩොලර් මිලියන 547.0 ක ඍජු මිලදී ගැනීම් ප්‍රමාණයක් සහ එ.ජ. ඩොලර් මිලියන 732.0 ක ඍජු විකුණුම් ප්‍රමාණයක් සිදුකර තිබුණි. මෙය එ.ජ. ඩොලර් මිලියන 185.0 ක ශුද්ධ ඍජු විදේශ විනිමය විකුණුම් අගයක් පෙන්වයි.

- **වසරේ පළමු මාස නවය තුළ පසුගිය වසරේ අනුරූපී කාලය හා සසඳා බැලීමේදී දේශීය විදේශ විනිමය වෙළඳපොළ ගනුදෙනු පරිමාව සියයට 2.5 ක ආන්තික වැඩි වීමක් පෙන්නුම් කරයි.** මෙම කාලය තුළ සිදුවූ අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 13.1 ක් වූ අතර, පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ සිදුවූ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 12.8 ක් විය. මෙම ගනුදෙනු වල දෛනික සාමාන්‍ය පරිමාව 2017 වසරේ අනුරූපී කාලපරිච්ඡේදය තුළ වාර්තා කරන ලද එ.ජ. ඩොලර් මිලියන 70.0 සමඟ සසඳා බැලීමේදී, එ.ජ. ඩොලර් මිලියන 73.0 ක් දක්වා වර්ධනයක් පෙන්වීය. කෙසේ වුවද, ඉදිරි වෙළඳපොළ ගනුදෙනු සලකා බැලීමේදී, 2017 වසරේ පළමු මාස නවය තුළ එ.ජ. ඩොලර් මිලියන 6.6 ක ගනුදෙනු ප්‍රමාණයක් වාර්තා කරන ලද අතර, 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ එහි අගය එ.ජ. ඩොලර් බිලියන 5.0 ක් දක්වා පහළ යෑමක් පෙන්නුම් කරයි.


### රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ

- **2018 වසරේ පළමු භාගය තුළ, දේශීය වෙළඳපොළෙහි ක්‍රමවත් නිකුතු පරිමාවන් පවත්වා ගන්නා අතරම, මූල්‍යන අවශ්‍යතා වැඩි කොටසක් විදේශීය වෙළඳපොළෙන් ලබා ගන්නා ලදී.** 2017 අවසාන භාගයට සාපේක්ෂව දේශීය වෙළඳපොළ තුළ පැවති ඉහළ පොලී අනුපාතයන් හා ද්‍රවශීලතා හිඟය පිළිබිඹු කරමින්, 2018 වසරේ පළමු භාගයේදී ණය නිකුත් කිරීම සඳහා එ.ජ. ඩොලර් මිලියන 2,500 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම, එ.ජ. ඩොලර් මිලියන 712.2 ක ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම සහ ප්‍රධාන වශයෙන් මධ්‍යකාලීන කල්පිරීම් වලින් යුක්ත රුපියල් බිලියන 337.0 ක භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම වැනි උපායමාර්ග යොදා ගන්නා ලදී. මෙමඟින්, දැනට දේශීයව ආයෝජනය සඳහා පවතින අරමුදල් මත ඇතිවිය හැකි පීඩනය අවම වනු ඇතැයි අපේක්ෂා කළ අතරම ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළෙහි පොලී අනුපාතිකවල ඇතිවිය හැකි ඉහළ යෑම් හමුවේ හිතකර ප්‍රතිඵල අත්කරදෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. වසරේ පළමු භාගයේදී මධ්‍ය කාලීන භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම තුළින්, දේශීය රාජ්‍ය සුරැකුම්පත්වල සාමාන්‍ය කල්පිරීමේ කාලය පහළ දැමීමට සීමිත දායකත්වයක් ලබාදුන්නද, ඒ හරහා රාජ්‍ය ණය සුරැකුම්පත්වල ස්ථාවර පොලී අනුපාත ව්‍යුහයක් පවත්වා ගැනීමට ණය කළමනාකරුවන්ට හැකිවිය.

- **රාජ්‍ය සුරැකුම්පත් ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය, 2017 වසරේ අදාළ කාලපරිච්ඡේදය හා සසඳන කල 2018 පළමු භාගය අවසානයේදී සමාන්තරව පහළට**

**8.18 රූප සටහන**

**රජයේ සුරැකුම්පත්වල ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**ගමන් කිරීමක් දක්නට ලැබිණි.** 2017 පළමු භාගය අවසානය හා සැසඳීමේදී, 2018 පළමු භාගය අවසානයේදී, දින 91, දින 182 හා දින 364 භාණ්ඩාගාර බිල්පත්හි ද්විතියික වෙළඳපොළ ඵලදා අනුපාතික, පිළිවෙලින්, පාදකාංක 118 කින්, 140 කින් හා 107 කින් අඩුවිය. ක්‍රියාකාරී ලෙස අලෙවි වූ, වසර 2 සිට වසර 10 ක් දක්වා පරිණත කාලයෙන් යුත් භාණ්ඩාගාර බැඳුම්කර වෙළඳපොළෙහි ඵලදා අනුපාතිකයන්, එම කාලපරිච්ඡේදය තුළ පාදකාංක 64-90 ක පරාසය තුළ අඩුවිය. වැඩිදියුණු වූ වෙළඳපොළ තත්ත්වයන් හා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හරහා විදේශීය ගලා ඒම් සමග සිදු වූ රාජ්‍ය සුරැකුම්පත් නිකුත් කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය හා පුරෝකථනය කිරීමේ හැකියාව ඉහළ යෑම මෙන්ම රාජ්‍ය සුරැකුම්පත් නිකුත්කිරීමේ ක්‍රියාවලිය, ණය සේවාකරණ ගෙවීම් සමග ගැලපීම යනාදී කරුණු, දේශීය වෙළඳපොළ තුළ පොලී අනුපාතික මත වූ පීඩනය ලිහිල් කිරීමට හිතකර ලෙස දායක විය. විදේශීය ආයෝජකයන් විසින් ඔවුන්ගේ ආයෝජන, විදේශීය හා නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්ගෙන් ඉවත් කර ගැනීම යම් දුරකට පිළිබිඹු කරමින්, අනේවාසිකයන් සතු භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය, 2017 වසර අවසානයේදී වාර්තා වූ රුපියල් බිලියන 322.6 ක් වූ අගයක සිට 2018 ජූලි මස අවසානයේදී රුපියල් බිලියන 287.8 ක් දක්වා පහළ ගියේය.

## සාංගමික ණය සුරැකුම්පත් වෙළඳපොළ


- **2018 වසරේ පළමු මාස නවය තුළදී වාණිජ පත්‍ර වෙළඳපොළ සාපේක්ෂව අඩු ක්‍රියාකාරීත්වයක් පෙන්වීය.** 2018 වසරේ පළමු මාස නවය තුළදී නිකුත් කළ වාණිජ පත්‍රවල වටිනාකම රුපියල් බිලියන 1.7 ක් වූ අතර, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී එම වටිනාකම රුපියල් බිලියන 5.8 ක් විය. වාණිජ පත්‍ර වල පොලී අනුපාතික 2017 වසරේදී වාර්තා කළ සියයට 14.25 සහ සියයට 16.50 අතර පරාසයක සිට 2018 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සියයට 13.10 සහ සියයට 15.00 අතර පරාසයක විචලනය විය. මෙම කාලපරිච්ඡේදය තුළදී නිකුත් කරන ලද සියළුම වාණිජ පත්‍ර මාස 3 ක පරිණත කාලයක් සහිත විය. නොපියවූ සමස්ත වාණිජ පත්‍ර වල වටිනාකම 2017 සැප්තැම්බර් මස වන විට පැවති රුපියල් බිලියන 2.5 ට සාපේක්ෂව 2018 සැප්තැම්බර් මස අවසානය වන විට රුපියල් බිලියන 1.2 ක් විය.

- **බැංකු සඳහා වන බාසල් III අවශ්‍යතාවයන්ට අනුව ඇතිවූ නව ලැයිස්තුගත කිරීම් හේතුවෙන් පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළදී සාංගමික බැඳුම්කර වෙළඳපොළ වර්ධනය විය.** 2018 වසරේ පළමු මාස නවය තුළදී සමාගම් 10 ක් විසින් සාංගමික බැඳුම්කර 20 ක් නිකුත් කරන ලද අතර, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී සමාගම් දෙකක් විසින් සාංගමික බැඳුම්කර 7 ක් නිකුත් කරන ලදී. මෙම කාලපරිච්ඡේදය තුළදී ලැයිස්තුගත කරන ලද සමාගම් දහයෙන් අටක් බැංකු හා මූල්‍ය අංශය තුළින් විය. පෙර වසරේ පැවති රුපියල් බිලියන 10.0 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළදී ලැයිස්තුගත කරන ලද සාංගමික බැඳුම්කර වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 52.3 ක් දක්වා වැඩි විය. 2018 වසරේ පළමු මාස නවය තුළදී නිකුත් කරන ලද සාංගමික බැඳුම්කර වල පොලී අනුපාතික සියයට 12.00 ත් සියයට 14.75 ත් අතර පරාසයක විචලනය වූ අතර, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළදී, එය සියයට 11.95 ත් 15.00 ත් අතර පරාසයක පැවතුනි. මෙම කාලපරිච්ඡේදය තුළදී එක් ශුන්‍ය කූපන් ණයකරයක් නිකුත් කරන ලදී.

## කොටස් වෙළඳපොළ

- **කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව 2017 වසරේදී අත් කර ගත් වර්ධනයට ප්‍රතිවර්තව 2018 වසරේ පළමු මාස නවය තුළදී අඩු ක්‍රියාකාරීත්වයක් වාර්තා කරන ලදී.** මෑතකාලීන ගෝලීය ප්‍රවණතා, විදේශ විනිමය මත ඇති වූ පීඩනය සහ ඉදිරි ප්‍රතිපත්තිමය නිර්දේශ

**8.19 රූප සටහන**
**කොටස් වෙළඳපොළ මිල දර්ශකවල විචලනය**




මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

8

**8.8 සංඛ්‍යා සටහන**

**කොටස් වෙළඳපොළෙහි තෝරාගත් දර්ශක**

| අයිතම | 2016 සැප්. අවසානයට | 2017 සැප්. අවසානයට | 2017 අවසානයට | 2018 සැප්. අවසානයට |
|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,534.8 | 6,438.2 | 6,369.3 | 5,862.2 |
| වාර්ෂික වෙනස (%) | -5.2 | 3.4 | 2.3 | -8.0 |
| එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය (2004 = 1,000) | 3,617.3 | 3,688.0 | 3,671.7 | 3,002.0 |
| වසර ආරම්භයේ සිට වෙනස (%) | -0.2 | 5.5 | 5.0 | -18.2 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු. බිලියන) | 2,785.7 | 2,919.7 | 2,899.3 | 2,752.9 |
| ද.ජා.නි.යේ ප්‍රතිශතයක් ලෙස (%)* | 23.5 | 24.7 | 24.5 | 20.7 |
| වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතිකය | 13.4 | 10.7 | 10.6 | 9.2 |
| සාමාන්‍ය දෛනික පිරිවැටුම (රු. මිලියන) | 737.2 | 914.8 | 915.3 | 787.6 |
| ද්විතීයික වෙළඳපොළ තුළ ශුද්ධ සමුච්චිත විදේශිය මිළදී ගැනුම් (එ.ජ. ඩොලර් මිලියන) | -3.2 | 17.2 | 17.7 | -6.2 |
| ලැයිස්තුගත කළ සමාගම් ගණන | 295 | 295 | 296 | 297 |
| හිමිකම් නිකුතුන් ගණන | 6 | 14 | 15 | 15 |
| හිමිකම් නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) | 2.5 | 42.3 | 51.6 | 37.0 |
| මූලික මහජන නිකුතුන් | 3 | 2 | 2 | 3 |
| මූලික මහජන නිකුතුන්ගෙන් රැස්කරගත් අරමුදල් ප්‍රමාණය (රු. බිලියන) | 1.9 | 8.5 | 1.0 | 15.2 |

* 2017 වසරේ ද.ජා.නි මත පදනම්ව (රු. බිලියන 13,317)


මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

පිළිබඳ ආයෝජකයින්ගේ අවිනිශ්චිතතාව ඉහළ යෑම හේතුවෙන් අස්ථාවර විදේශ සහභාගීත්වය සමඟ වෙළඳපොළ විචලනයක් පෙන්වීය.

- **කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහි මිල දර්ශක, වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය සහ සාමාන්‍ය පිරිවැටුම පහත වැටුණු අතර ශුද්ධ විදේශීය විකුණුම් ඉහළ යන ලදී.** 2018 වසරේ සැප්තැම්බර් මස අවසානය තෙක් සමස්ත කොටස් මිල දර්ශකය සියයට 8.0 කින් ද එස් ඇන්ඩ් පී ශ්‍රී ලංකා 20 දර්ශකය සියයට 18.2 කින් ද අඩු විය. වෙළඳපොල ප්‍රාග්ධනීකරණය 2017 වසර අවසානයේදී වාර්තා කළ රුපියල් බිලියන 2,899.3 ට සාපේක්ෂව 2018 වසරේ සැප්තැම්බර් අවසානය වන විට රුපියල් බිලියන 2,752.9 ක් දක්වා අඩු විය. සාමාන්‍ය දෛනික පිරිවැටුම 2017 වසර තුළදී වාර්තා කළ රුපියල් මිලියන 915.3 සමඟ සසඳන විට 2018 වසරේ පළමු මාස නවය තුළදී රුපියල් මිලියන 787.6 ක් විය. කෙසේ වුවද, 2018 වසරේ වාර්තා කළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2016 වසර තුළදී වාර්තා කළ රුපියල් මිලියන 737.2 ක සාමාන්‍ය පිරිවැටුමට වඩා සුළු වශයෙන් ඉහළ අගයක් ගන්නා ලදී. සමස්ත ගනුදෙනු සංඛ්‍යාව 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ 727,064 ට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළදී 675,796 ක් දක්වා අඩු විය. වෙළඳපොළ මිල ඉපැයීම් අනුපාතය 2017 වසර අවසානයේදී පැවති වාර 10.6 ට සාපේක්ෂව 2018 වසරේ සැප්තැම්බර් මස අවසානය වනවිට වාර 9.2 ක් දක්වා තවදුරටත් පහළ යන ලදී.

**8.20 රූප සටහන**

**කොළඹ කොටස් හුවමාරුවෙහි විදේශීය සහභාගීත්වය**




මූලය: කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව

- **2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව වාර්තා කරන ලද රුපියල් බිලියන 17.2 ක විදේශීය ගලාඒම් සමඟ සසඳන කළ 2018 වසරේ සැප්තැම්බර් මස අවසානය වන විට වෙළඳපොළ සමස්ත ශුද්ධ විදේශීය ගලායෑම් රුපියල් බිලියන 6.2 ක් විය.** මෙම කාලසීමාව තුළදී, කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව මූලික මහජන නිකුතුන් 3 ක් මඟින් රුපියල් බිලියන 15.2 ක් සහ හිමිකම් නිකුතුන් 15 ක් මඟින් රුපියල් බිලියන 37.0 ක අරමුදල් රැස් කර ගන්නා ලදී. 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ සියයට 46.2 සමඟ සසඳන කළ 2018 වසරේ දී විදේශ ආයෝජකයින් පිරිවැටුමෙන් සියයට 45.3 ක් විය.

## සංවර්ධන මූල්‍ය හා මූල්‍ය ප්‍රවේශය

- **රජයේ නියෝජිතයෙකු වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, 2018 වසරේ පළමු මාස නවයේදී නව සංවර්ධන මූල්‍ය ප්‍රතිපත්තිමය උපාය මාර්ගයන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මෙන්ම සහනදායී ණය යෝජනා**

8

ක්‍රම ක්‍රියාත්මක කිරීම අඛණ්ඩවම සිදු කරන ලදී. මෙම නව ප්‍රවේශයන් සහ ණය මෙහෙයුම් පුළුල් කිරීම රට තුළ තුලිත ආර්ථික වර්ධනයක් මෙන්ම රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා දායක විය.

- 2018 වසරේ පළමු මාස නවය තුළදී, ණය අතිරේකකරණ සේවාවන් සපයමින් විවිධ ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ / හෝ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය කිරීම, පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩවම සිදු කරන ලදී. මෙම ණය යෝජනා ක්‍රම හරහා රට පුරා විසිරී සිටින පුද්ගලයින් සහ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ඇරිය හැකි මූල්‍ය පහසුකම් සපයා ඇත. මෙම ප්‍රතිලාභීන් කෘෂිකාර්මික සහ සත්ත්ව පාලන, කාර්මික සහ සේවා යන අංශ ඇතුලුව පුළුල් පරාසයක අංශ නියෝජනය කරන ලදී. විධිමත් මූල්‍ය අංශයට ප්‍රවිශ්ඨ වී නොමැති අය සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා මූල්‍ය සාක්ෂරතාවය සහ නිපුණතා සංවර්ධන වැඩසටහන් මාලාවක්ද ක්‍රියාත්මක කෙරිණි.

- 2018 වසරේ පළමු මාස නවය තුළදී, ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම 8 ක් මඟින් සහ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා රුපියල් මිලියන 11,719.4 ක ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 73,656 ක් අතරේ මුදාහරින ලදී. මින් බහුතරයක් එනම් සියයට 51.0 ක ණය ප්‍රමාණයක් පොලී සහනාධාර යෝජනා ක්‍රම හරහා මුදාහරින ලද අතර ඉතිරි සියයට 49.0 ක ණය ප්‍රමාණය ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම හරහා මුදා හැරිණි. මෙම යෝජනා ක්‍රම සඳහා අරමුදල් මූලාශ්‍ර වූයේ, ශ්‍රී ලංකා රජය,

**8.9 සංඛ්‍යා සටහන**

**අරමුදල් සපයනු ලබන ප්‍රභවයට අනුව ණය මුදා හැරීම**

| අරමුදල් මූලාශ්‍රය | කොටස % | | | |
|---|---|---|---|---|
| | 2017 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | |
| | ණය සංඛ්‍යාව | ණය ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ණය ප්‍රමාණය රුපියල් මිලියන |
| රජයේ අරමුදල් | 82.3 | 61.8 | 92.7 | 71.5 |
| මහ බැංකුවේ අරමුදල් | 8.4 | 33.1 | 6.6 | 27.6 |
| ආධාර දෙන ආයතන වල අරමුදල් (අ) (ආ) | 9.4 | 5.1 | 0.7 | 0.9 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) 2017 වසරේදී දෙසැම්බර් 31 දින අවසන් වූ ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහනෙහි ණය යෝජනා ක්‍රමයන් 5 හි 2017 වසරට අදාළ දත්ත ඇතුළත් වේ.
(ආ) SAPP - චක්‍රීය ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමයෙහි 2018 මැයි සිට සැප්තැම්බර් දක්වා වූ දත්ත ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව, අරමුදල් සපයනු ලබන ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතනයි. මීට අමතරව, "අත්වැල" ණය යෝජනා ක්‍රමය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මඟින් අරමුදල් සපයනු ලබන කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය සංශෝධනයන් හඳුන්වා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව පියවර ගන්නා ලදී.

- ශ්‍රී ලංකා රජයේ අරමුදල් උපයෝගී කර ගනිමින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 6 ක් සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම 6 ක් හරහා 2018 වර්ෂයේ පළමු මාස නවය තුළදී රුපියල් මිලියන 8,459.7 ක එනම් සියයට 72.2 ක ණය ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 68,754 ක් වෙත මුදාහැර ඇත. 2017 වර්ෂයේ මෙම කාලපරිච්ඡේදය හා සැසඳීමේදී ශ්‍රී ලංකා රජය මඟින් අරමුදල් සපයන ලද මෙම ණය යෝජනා ක්‍රම වල මුළු මුදාහැරීම් සියයට 11.4 කින් ඉහළ ගොස් ඇත. මෙම ණය යෝජනා ක්‍රම අතරින්, පොලී

**8.10 සංඛ්‍යා සටහන**

**රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයන්හි මුළු ණය මුදාහැරීම්**

| ණය ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2017 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | 7,495.0 | 372.0 | 9,668.0 | 482.1 | 29.0 | 29.6 |
| දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල | 10,922.0 | 922.5 | 3,573.0 | 336.2 | -67.3 | -63.6 |
| ස්වශක්ති* | 3.0 | 0.4 | 1,608.0 | 332.9 | 99.8 | 99.8 |
| අත්වැල | - | - | 3,543.0 | 1,499.7 | - | - |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය අදියර II | - | - | 216.0 | 99.8 | - | - |
| නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය | 45,911.0 | 4,959.5 | 50,146.0 | 5,709.0 | 9.2 | 15.1 |
| තේ කර්මාන්ත ශාලා සඳහා කාරක ප්‍රාග්ධන ණය යෝජනා ක්‍රම* | 5,871.0 | 1,341.4 | - | - | - | - |
| **එකතුව** | **70,202.0** | **7,595.8** | **68,754.0** | **8,459.7** | **-2.1** | **11.3** |

* 2017.08.14 දින ණය මුදාහැරීම් අවසන් කරන ලදී. 2019 අගෝස්තු මස දක්වා පොලී සහනාධාර ගෙවීම් අඛණ්ඩව සිදු වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

8

**8.11 සංඛ්‍යා සටහන**

**ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයන්හි මුළු ණය මුදා හැරීම්**

| ණය යෝජනා ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2017 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | |
| | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| සෞභාග්‍යා | 5,977.0 | 3,048.3 | 4,627.0 | 2,996.9 | -22.6 | -1.7 |
| මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (අ) | 1,160.0 | 1,024.8 | 275.0 | 262.7 | -76.3 | -74.4 |
| **එකතුව** | **7,137.0** | **4,073.1** | **4,902.0** | **3,259.6** | **-31.3** | **-20.0** |

(අ) රු.බිලියන 6ක් වූ ඉලක්ක ගත ණය මුදල් ප්‍රමාණය මුදා හැරීමෙන් පසුව 2018 ජූනි මසදී සාර්ථකව අවසන් කරන ලදී.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ලෙස "සරුසාර" ණය යෝජනා ක්‍රමය යටතේ කෙටි කාලීන භෝග වර්ග 33 ක් සඳහා ගොවීන් 50,146 ක් වෙනුවෙන් පොලී සහනාධාර ලබාදෙමින් සැලකිය යුතු කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. 2018 වසරේ පළමු මාස නවය තුළදී මුළු ණය මුදා හැරීම් වලින් සියයට 48.7 ක් සහ රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 67.5 ක් "සරුසාර" ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හැර ඇත. ප්‍රතිලාභීන් 3,543 අතරේ රුපියල් මිලියන 1,499.7 ක ප්‍රතිමූල්‍ය පහසුකම් ලබාදෙමින් ශ්‍රී ලංකා රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක කරනු ලබන "අත්වැල" ණය යෝජනා ක්‍රමය, "සරුසාර" ණය යෝජනා ක්‍රමයට පසුව ඊළඟට ඉහළම කාර්යසාධනයක් පෙන්නුම් කරන ලදී. මෙය අදාළ කාලය තුළ සිදු කළ මුළු මුදාහැරීම් වලින් සියයට 12.8 ක් හා රජයේ අරමුදල් මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රම යටතේ මුදා හරින ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 17.7 ක් ලෙස ගණනය කර ඇත. ශ්‍රී ලංකා රජය විසින් ආපදාවක් ලෙස හඳුනාගෙන ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දෙන ලද ආපදාවන්ගෙන් හානියට පත් ව්‍යවසායන්ගේ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා "අත්වැල" ණය යෝජනා ක්‍රමය 2017 අගෝස්තු මසදී හඳුන්වා දෙන ලදී. මීට අමතරව, රුපියල් බිලියන 7.0 ක ණය මුදල් ප්‍රමාණයක් ප්‍රතිලාභීන් 94,893 ක් අතරේ මුදාහරිමින්, රටේ දිළිඳුකම පිටුදැකීම සඳහා දායක වූ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල සැලසුම්කල පරිදි 2018 ජූලි මස 15 වන දින සාර්ථකව අවසන් කරන ලදී.

- **ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ මූල්‍ය කටයුතු පුළුල් කිරීම සහ කිරි කර්මාන්තය තව දුරටත් ඉහළ නැංවීම අරමුණුකර ගනිමින් පිළිවෙළින් ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය (SLS) සහ පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයක් ලෙස මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය (CSDDLS) යන ණය යෝජනා ක්‍රම 2 සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අඛණ්ඩවම අරමුදල් ලබා දෙන ලදී.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම අතරින්, ප්‍රමුඛතම ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ණය යෝජනා ක්‍රමය ලෙස ක්‍රියාත්මක වන "සෞභාග්‍යා" ණය යෝජනා ක්‍රමය මගින් 2018 වසරේ පළමු මාස නවය තුළදී රුපියල් මිලියන 2,996.9 ක් එනම් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම යටතේ ණය මුදා හැරීම් වලින් සියයට 91.9 ක් වන අතර, මුළු මුදාහැරීම් වලින් සියයට 25.6 ක් ලෙස ගණනය කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පොලී සහනාධාර සපයනු ලබන මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය, කිරි ව්‍යවසායකයන් සඳහා මූල්‍ය පහසුකම් ලබාදීමේ අරමුණින් යුතුව අඛණ්ඩවම ක්‍රියාත්මක විය. කිරි වලින් ස්වයංපෝෂිත වීමේ ජාතික අරමුණට දායක වෙමින් කිරි ආශ්‍රිත සියලුම ක්‍රියාකාරකම් ආවරණය වන පරිදි මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ කිරි ගොවීන්ට ලබා දෙන ලද ණය මුදල් සඳහා වූ පොලී සහනාධාර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන ලදී.

- **සමස්තයක් ලෙස ගත් කල, 2017 වසරේ එම කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස නවය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයන ලද ණය යෝජනා ක්‍රම යටතේ ණය මුදාහැරීම් සියයට 20.0 කින් පහළ ගොස් ඇත.** මහා පරිමාණ කිරි නිෂ්පාදන සංවර්ධන ණය යෝජනා ක්‍රමය 2018 ජූනි මස අවසන් කිරීම මෙම පහළ යෑමට සියයට 93.7 ක්ම හේතු වූ අතර මෙම යෝජනා ක්‍රමයේ එහි ඉලක්කගත ණය ප්‍රමාණය වූ රුපියල් බිලියන 6.0 ක මුදල මුදා හැර අවසන් විය.

**8.12 සංඛ්‍යා සටහන**

**ආධාර සපයනු ලබන ආයතනවල අරමුදල් මඟින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමයන්හි ණය මුදා හැරීම්**

| ණය ක්‍රමය | ණය මුදාහැරීම | | | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|
| | 2017 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | | 2018 ජන.-සැප්. | |
| | ණය ගණන | ණය ප්‍රමාණය රුපියල් මිලියන | ණය ගණන | ණය ප්‍රමාණය රුපියල් මිලියන | ණය සංඛ්‍යාව | ප්‍රමාණය රුපියල් මිලියන |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන* | 7,979.0 | 622.0 | - | - | - | - |
| කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්වය වැඩසහන (SAPP)** | - | - | 527.0 | 106.4 | - | - |
| **එකතුව** | **-** | **-** | **527.0** | **106.4** | **-** | **-** |

*2017 දෙසැම්බර් 31 අවසන් කරන ලද ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ණය යෝජනා ක්‍රමයන්හි කාර්යය සාධනය
*2018 මැයි සිට සැප්තැම්බර් දක්වා

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

- **ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වූ ක්ෂුද්‍ර මූල්‍ය, තරුණ දිරිය, පිටත වගාකරුවන් සඳහා වූ ණය යෝජනා ක්‍රමය (ප්‍රාග්ධන සහ කාලීන ණය යෝජනා ක්‍රම) සහ ආපදා වලින් පසු ආර්ථික කටයුතු නැවත නගා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (PEARL) යනාදී කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මඟින් අරමුදල් සපයන ලද කෘෂි ව්‍යාපාර සංවර්ධන ණය යෝජනා ක්‍රම අවසන් වීමත් සමඟම, කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල සහ ශ්‍රී ලංකා රජය විසින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) ආරම්භ කිරීම සඳහා 2018 වසරේ පළමු භාගයේදී මූල්‍ය ගිවිසුමක් අත්සන් කරන ලදී.** කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මඟින් අරමුදල් සපයන ලද පෙර පැවති ව්‍යාපෘති වල පවතින සහ අනාගතයේදී ලැබිය යුතු අය කර ගැනීම් සහ කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල මඟින් ලබා දෙන නව අරමුදල් යොදා ගනිමින් කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන සඳහා ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල එක්ව ඒකාබද්ධ ණය අරමුදලක් නිර්මාණය කර ඇත.

- **කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි මූලික අරමුණ වනුයේ, දරිද්‍රතාවය අවම කිරීම සහ ශ්‍රී ලාංකික කුඩා පරිමාණ ප්‍රජාවගේ තරඟකාරීත්වය වැඩි දියුණු කිරීමයි.** වාණිජමය වශයෙන් කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධතියට අයත් සුළු පරිමාණ ගොවීන් 57,000 කගේ ආදායම සහ පෝෂණ ගුණය ඉහළ නැංවීමත් මෙමගින් අපේක්ෂා කෙරේ. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන ණය යෝජනා ක්‍රම 6 කින් යුක්ත වේ. මෙම ණය යෝජනා ක්‍රමවල මූලික කටයුතු මේ වන විට ආරම්භක අවධියේ ඇත. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ 2018 සැප්තැම්බර් මස අවසානයේදී රුපියල් මිලියන 224.7 ක ණය මුදල් ප්‍රමාණයක් සඳහා ණය ප්‍රතිලාභීන් 1,073 ක් ලියාපදිංචි කර ඇත. 2018 වසරේ මැයි මස සිට සැප්තැම්බර් අග දක්වා ණය ප්‍රතිලාභීන් 527 ක් සඳහා රුපියල් මිලියන 106.4 ක් ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දී ඇත.

- **තුලිත සහ සියලුදෙනාම අන්තර්ගත වූ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීමට එලදායී ණය සැපයීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා මහ බැංකුව විසින් නව ප්‍රතිපත්තිමය උපාය මාර්ගයන් කිහිපයක් ගන්නා ලදී.** ශ්‍රී ලංකාව සඳහා ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ උපාය මාර්ගයක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික පියවරයන් ගන්නා ලදී. මෙයට අදාළව, ලෝක බැංකු සමූහයේ සාමාජිකයෙකු වන ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවයේ තාක්ෂණික සහ මූල්‍ය සහය ලබා ගැනීමට කටයුතු කර ඇත. ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ පුළුල් උපායමාර්ගයක් සැකසීමේ මූලික අරමුණ වනුයේ, රටපුරා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමට වඩාත් එලදායි සහ කාර්යක්ෂම ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීමයි. ඒ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාව සමඟ සහයෝගීතා ගිවිසුමක් 2018 ජනවාරි මාසයේදී අත්සන් කරන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම යටතේ ණය ලියාපදිංචිය සහ ණය සඳහා ප්‍රතිමූල්‍ය ලබාදීමේ ක්‍රියාවලිය ස්වයංක්‍රීයකරණය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු 2018 වසරේ පළමු මාස නවය තුළදී ආරම්භ කරන ලදී. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි මූල්‍ය ගිවිසුමෙහි

ආයතනික ශක්තිමත් කිරීමේ සංරචකය යටතේ කෘෂි කාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් අරමුදල් සපයන ලද කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන යටතේ වූ ණය යෝජනා ක්‍රම ආරම්භ වීමත් සමඟ ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය ආරම්භ වේ. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය, සහභාගීත්ව මූල්‍ය ආයතන සහ අනෙකුත් අදාල පාර්ශවකරුවන්ගේ සහයෝගයෙන් යුතුව මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට අපේක්ෂිතය. රටේ ආහාර හා පෝෂණ සුරක්ෂිතතාවය සහතික කිරීම සඳහා දේශීය කෘෂිකාර්මික නිෂ්පාදනය වැඩි කිරීමේ අරමුණින්, රට තුළ පවතින විභව ගම්මාන තෝරා, වාණිජමය කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා "එක් ගමකට එක් නිෂ්පාදනයක්" සංකල්පය ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පියවර ගන්නා ලදී. මෙම වැඩසටහනෙහි පුළුල් පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකා රජයේ ආහාර නිෂ්පාදන වැඩසටහනෙහි තිරසාර සංවර්ධන අරමුණ සඳහා සහය දැක්වීමයි.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගත් මෙම ප්‍රයත්නයන්ට අමතරව, ශ්‍රී ලංකා රජයේ 2025 දැක්ම හා අනුකූලව "ව්‍යවසායි ශ්‍රී ලංකාවක්" වැඩසටහන හඳුන්වා දෙන ලදී.** "ව්‍යවසායි ශ්‍රී ලංකාවක්" වැඩසටහන යටතේ රටේ ව්‍යවසායකයන් සඳහා සියයට 25 සහ සියයට 100 ක් දක්වා පොලී සහනාධාර සපයනු ලබන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රම 15 ක් ශ්‍රී ලංකා රජය විසින් හඳුන්වා දෙන ලදී. මෙම සහන යෝජනා ක්‍රමයන්හි ප්‍රධාන අරමුණ වනුයේ, ව්‍යවසායී අභිලාෂයන් ඇති සෑම ශ්‍රී ලාංකිකයකුටම ඔවුන්ගේ එම අරමුණ සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම සඳහා යටිතල ව්‍යූහයක් ඇති කිරීමයි.

- **මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට අදහස් කරනු ලබන ඕනෑම ආයතනයක් විසින් පොදු මහ ජනතාවගේ නිපුණතා සංවර්ධනය සහ ධාරිතා ගොඩ නැංවීමේ අවශ්‍යතාවය යටපත් කළ නොහැකි බව හඳුනාගනිමින් 2018 පළමු මාස නවය තුළදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් ගණනාවක් පවත්වමින් මූල්‍ය සාක්ෂරතාවය සහ මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී.** අදාළ කාලය තුළදී ඉලක්ක කර ගත් වැඩසටහන් ගණන වූ 114 ඉක්මවා යමින් ශ්‍රී ලංකා මහ බැංකුව, දැනුවත් කිරීමේ වැඩසටහන් 121 ක් පවත්වන ලදී.

## ගෙවීම් සහ පියවීම් පද්ධතිවල වර්ධනය

- **2018 වසර තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් තනි පුද්ගලයන්ගේ සහ ආයතනයන්හි ගෙවීම් සහ පියවීම් අවශ්‍යතා සලසා දීම සඳහා රට තුළ ඩිජිටල් ගෙවීම් යාන්ත්‍රණයට අනුග්‍රහ දැක්වීමට ක්‍රියාමාර්ග කිහිපයක් යොදා ගන්නා ලදී.** තත්කාලීන දළ පියවීම් පද්ධතිය (RTGS) සහ ලංකාසෙක්‍යු (LankaSecure) පද්ධතිය නමින් වන එකිනෙක සබැඳුණු පද්ධති දෙකකින් සමන්විත ලංකාසෙට්ල් පද්ධතිය මගින් රට තුළ විශාල වටිනාකම් සහිත ගනුදෙනු පියවීම් සඳහා ආරක්ෂාකාරී සහ විශ්වාසදායක යාන්ත්‍රණයක් සපයා දීම අඛණ්ඩව සිදු කරන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතිය ගනුදෙනුකරුවන්ගේ සහ අන්තර් බැංකු විශාල වටිනාකම් සහිත කාල සංවේදී ගනුදෙනු පියවීම සිදුකරන අතර ලංකාසෙක්‍යු පද්ධතිය සුරැකුම් ගනුදෙනු, ගෙවීමට එරෙහිව පැවරීම (Delivery versus Payment-DvP) පදනම මත පියවීම සිදු කරයි. 2018 වසරේ පළමු මාස හය තුළ මුදල් නොවන ගෙවීම්වල මුළු වටිනාකමින් සියයට 84.1 ක් සිදුකරමින් තත්කාලීන දළ පියවීම් පද්ධතිය, රට තුළ ශ්‍රී ලංකා රුපියල් ගනුදෙනුවල ප්‍රධාන අන්තර් බැංකු අරමුදල් හුවමාරු පද්ධතිය ලෙස තවදුරටත් කටයුතු කරමින් සිටියි. 2018 වසරේ පළමු මාස නවය තුළ තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් පියවන ලද දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ එහි වටිනාකම අනුපිළිවෙලින් 1,644.5 ක් සහ රුපියල් බිලියන 379.2 ක් විය.

- **දීපව්‍යාප්ත ලෙස චෙක්පතක් උපලබ්ධිවීමේ කාලය එක් දිනකට (T+1) අඩුකිරීම මගින් චෙක්පත් නිෂ්කාශනයේ කාර්යක්ෂමතාව වැඩිකිරීමේ පරමාර්ථයෙන් 2006 දී හඳුන්වා දුන් ඡායාගත චෙක්පත් පිළිබිඹු නිෂ්කාශන පද්ධතිය (CITS) මගින් සුළු පරිමාණ ගෙවීම් කාර්යක්ෂම ලෙස පියවීම තවදුරටත් ඉටු කරනු ලබයි.** 2018 වසරේ පළමු මාස නවය තුළ නිෂ්කාශනය කරන ලද මුළු චෙක්පත් ප්‍රමාණය සහ ඒවායේ වටිනාකම පිළිවෙළින් 37,735,279 ක් සහ රුපියල් ට්‍රිලියන 7.9 ක් විය.

- **විශාල ගනුදෙනු ප්‍රමාණයකට පහසුකම් සැලසීමට මාර්ගගත (online) යාන්ත්‍රණයක් සපයාදෙනු ලබන ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය (SLIPS) පද්ධතිය, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී තවදුරටත් සුමට ලෙස ක්‍රියාත්මකව පැවතුණි.** මෙම පද්ධතිය ප්‍රධාන වශයෙන් භාවිතා කරනු ලබන්නේ

වැටුප් සහ විශ්‍රාම වැටුප් වැනි අඩු වටිනාකම් සහිත ගෙවීම් විශාල ප්‍රමාණයක් එකවර සිදු කිරීම සඳහායි. ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය හරහා 2018 වසරේ පළමු මාස නවය තුළ පියවන ලද ගනුදෙනුවල ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 24,291,209 සහ රුපියල් බිලියන 1,452.5 ක් විය.

- **ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 'ලංකාපේ' (Lanka Pay) සන්නාමය යටතේ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම (LCPL) මඟින් මෙහෙයවනු ලබන කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CCAPS) ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම අඛණ්ඩව සිදුකරන ලදී.** කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය යනු එකිනෙක අතර ක්‍රියාත්මක වන පද්ධති 5 කින් සමන්විත ජාලයකි. එනම්, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS)සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS), ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර සඳහා වූ හවුල් යාන්ත්‍රණය (SAS), චිකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CMobS), වේ. පියවීම් අවදානම අඩු කිරීම සහ මෙම පද්ධතිවල සුමට ක්‍රියාකාරීත්වය සුරක්ෂිත කිරීම පිණිස ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදුවන අන්තර් බැංකු පියවීම් වාර ගණන වැඩිකිරීම සඳහා අතිරේක නිෂ්කාශන චක්‍ර හඳුන්වා දෙන ලදී.

- **කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රථම උප පද්ධතිය ලෙස, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය (CAS) 2013 ජූලි මාසයේදී මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී.** 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා රුපියල් බිලියන 248.3 වටිනාකමින් යුතු ගනුදෙනු මිලියන 29.4 ක් සිදු කරන ලදී. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණ ජාලය හරහා සිදු කරන කාඩ්පත් ගනුදෙනු වල සුරක්ෂිත බව වැඩි දියුණු කිරීමට, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් ස්ථාපනය කර ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා ඊ.එම්.වී (Europay, MasterCard and Visa) තාක්ෂණය යොදා ගන්නා ලෙස එම සාමාජිකයින් වෙත උපදෙස් ලබා දෙන ලදී. 2018 ජනවාරි 1 දින සිට ඊ.එම්.වී තාක්ෂණය නොමැති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල (ATM) සිදු කරනු ලබන වංචනික ගනුදෙනු මඟින් ඇතිවන වගකීම්, එවැනි ගනුදෙනු අත්පත් කරගන්නා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජික ආයතනය විසින් දරාගත යුතුය.

- **කාඩ්පත් සහ අනෙකුත් ගෙවීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දෙවන උප පද්ධතිය වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (CEFTS) 2015 අගෝස්තු මස 21 වන දින ස්ථාපිත කරන ලදී.** විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, අන්තර්ජාලය පදනම් කරගත් බැංකු කටයුතු, ජංගම දුරකතන පදනම් කරගත් බැංකු කටයුතු, ස්වයං සේවා ගෙවීම් යන්ත්‍ර (Kiosks) සහ බැංකු කවුළු වෙතින් යන බහුවිධ ගෙවීම් මාධ්‍ය හරහා සිදු කරනු ලබන ගෙවීම් නිෂ්කාශනය සඳහා පොදු යටිතල පහසුකම් සපයයි. 2018 ජනවාරි අවසානයේදී සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු මෙහි සාමාජිකත්වය ලබා ගන්නා ලදී. 2018 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලය තුළ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මඟින් රුපියල් බිලියන 429.6 ක වටිනාකමකින් යුතු ගනුදෙනු මිලියන 4.7 ක පියවීම් කටයුතු සිදු කරන ලදී.

- **ශ්‍රී ලංකා මහ බැංකුව, රටෙහි ගෙවීම් අවශ්‍යතා සලකා බලා විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි දියුණු කිරීම් කිහිපයක් ක්‍රියාත්මක කිරීමට අවසර දෙන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා රේගුව වෙත තත්කාලීන ගෙවීම් පහසුකම් සැලසීම සඳහා 2017 ජූලි 20 වන දින සිට ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව (LPOPP) ක්‍රියාත්මක කරන ලදී.** 2018 සැප්තැම්බර් අවසානය වනවිට ලියාපදිංචි වාණිජ බැංකු අටක් ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව සමඟ සම්බන්ධ වී ඇත. ලංකාපේ මංගත ගෙවීම් වේදිකාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ සම්බන්ධ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත අවසර ලබා දෙන ලදී. මීට අමතරව, වැරදි ගිණුම් අංක ඇතුළත් කිරීමෙන් ගනුදෙනු ප්‍රතික්ෂේප වීමට පිළියමක් ලෙස නව සංකල්පයක් වන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනු සඳහා ගෙවීම් හුවමාරු නම (Payment Exchange Name) හඳුන්වා දීමට අවසරය ලබා දෙන ලදී. ඒ අනුව, ගිණුම් අංකය වෙනුවට ආදායකයාගේ ජංගම දුරකතන අංකය සහ

ගිණුම සඳහා පවරන ලද අන්වර්ථ නාමයක් විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා අරමුදල් මාරුකිරීමට භාවිතා කරනු ලබයි.

- 2018 අවසානයට පෙර ක්‍රියාත්මක කරවීමට නියමිත විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) ප්‍රධාන වශයෙන් තම සාමාජික ආයතන මඟින් නිකුත් කළ ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ නිකුත් කළ ගෙවීම් කාඩ්පත්, ඕනෑම හිමිකාර කාඩ්පත් ක්‍රමයක් හෝ ජාත්‍යන්තර කාඩ්පත් ජාල මගින් එම ජාත්‍යන්තර ජාලවල එකඟත්වයට යටත්ව නිකුත් කළ කාඩ්පත් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර හරහා සිදු කරනු ලබන ගෙවීම් කාඩ්පත් ගනුදෙනු මාරුකිරීම් සහ නිෂ්කාශනයට පහසුකම් සපයනු ලබයි. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2018 අංක 02 දරන ලංකාක්ලියර් පුද්ගලික ආයතනය හා විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජික මූල්‍ය ආයතන සඳහා විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් පොදු විධානය නිකුත් කරන ලදී.

- දේශීය ගෙවීම් කාඩ්පත් ගනුදෙනුවල ගාස්තු අඩු කිරීම සඳහා ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක වැදගත්කම සලකා ශ්‍රී ලංකා මහ බැංකුව ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට ලංකාක්ලියර් පුද්ගලික සමාගමට අවසර දෙන ලදී. ජාත්‍යන්තර කාඩ්පත් ජාලයේ සහභාගීත්වය ඇතිව, ජාත්‍යන්තර පිළිගැනීම සහිත කාඩ්පත් නිකුත් කිරීමට ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය, ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය යටතේ නිකුත් කරනු ලබන කාඩ්පත් සඳහා මාරුකිරීම් සහ නිෂ්කාශන පහසුකම් සැලසීම සිදු කරනු ලැබේ.

- 2013 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති සඳහා වන නියෝග යටතේ ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම සේවා සැපයුම්කරුවන්ගේ මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් මුදල් පද්ධති අනුමත කළ අයුරින් ක්‍රියාත්මක වන බව තහවුරු කරගනු පිණිස බලපත්‍රලාභී ජංගම දුරකතන ආශ්‍රිත විද්‍යුත් මුදල් පද්ධති මෙහෙයුම්කරුවන් වෙත ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්දැයි සොයාබැලීම පිණිස 2018 දී එතැන් පරීක්ෂණ සිදුකරන ලදී.

- 2013 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් හා ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති රෙගුලාසිය යටතේ, වෙළඳුන්ට නියමිත කලට ගෙවීම් ලැබීම සහ කාඩ්පත් හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා සේවා සපයන්නන් හරහා කාඩ්පත් ගෙවීම් ලබාගැනීමේදී තත්ත්වයන් ස්ථාපනය කිරීමට ගෙවීම් කාඩ්පත් පදනම් කරගත් විද්‍යුත් වාණිජ ගනුදෙනු සේවා සපයන්නන් හරහා අත්පත් කරගන්නන් හට විධානයක් නිකුත් කරන ලදී.

- මූල්‍ය ගනුදෙනු සඳහා ජංගම අයදුම් මෘදුකාංග භාවිතයේ මෑතකාලීන ප්‍රවණතාව සැලකිල්ලට ගෙන ජංගම අයදුම් මෘදුකාංග හරහා සිදුකරනු ලබන ගනුදෙනුවල ආරක්ෂාව සහ ගනුදෙනුකරුවන්ගේ තොරතුරුවල රහස්‍යභාවය සුරක්ෂිත කිරීම සඳහා ප්‍රමිතීන් නියම කිරීම අත්‍යවශ්‍ය විය. ඒ අනුව, ගෙවීම් සේවා ලබාදීමට මූල්‍ය ආයතන භාවිතා කරන ජංගම අයදුම් මෘදුකාංග සඳහා අවම අනුකූලතා ප්‍රමිතීන් නියම කිරීමට ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම අයදුම් මෘදුකාංගයන්ට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශය 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නිකුත් කරන ලදී.

- ගෙවීම් පද්ධති පිළිබඳ උපදේශන සහ නිරීක්ෂණ කමිටුව වන ජාතික ගෙවීම් කවුන්සිලය (NPC) මඟින් ගෙවීම් සහ පියවීම් පද්ධතිවල මතුවන නිර්මාණාත්මක ගෙවීම් තාක්ෂණයන් හඳුන්වා දීම සඳහා මූල්‍ය තාක්ෂණ (FinTech) අංශය සහ බ්ලොක්චේන් (Blockchain) තාක්ෂණය පිළිබඳ වැඩිදියුණු කිරීම් අධ්‍යයනය කිරීමට කමිටු 2 ක් පත් කරන ලදී. මෙම කමිටු මඟින් ජාතික ගෙවීම් කවුන්සිලයට ඉදිරිපත් කල නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී.

## අපේක්ෂිත වර්ධනයන්

- පවත්නා මූල්‍ය ප්‍රතිපත්ති දිශානතියට අනුකූලව ණය ලබාදීමෙහි වර්ධනය මාධ්‍යකාලීනව ස්ථායී අනුපාතයක් දක්වා ක්‍රමිකව අඩුවීම අපේක්ෂා කෙරේ. මේ වනවිට බැංකුවල මෙහෙයුම් පරිසරයේ පැන නැගී ඇති අභියෝගකාරී තත්ත්වයන් සමඟම අක්‍රීය ණයවල ක්‍රමික ඉහළ යෑමක් පෙන්නුම් කෙරෙන අතර ණය මට්ටම ඉහළ යෑමත් සමඟම අක්‍රීය ණයවල විය හැකි ඉහළ යෑම පිළිබඳ බැංකු අවධානය යොමු කළ යුතු අතර මේ සම්බන්ධිත සියලු අවදානම් අවම කිරීම සඳහා සුදුසු අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග ගත යුතුය.

8

- **ඉහළ නංවන ලද ප්‍රාග්ධන අවශ්‍යතා සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් සමඟම බැංකුවල ප්‍රාග්ධන මට්ටම තවදුරටත් ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය.** ඉහළ නංවන ලද අවම ප්‍රාග්ධන අවශ්‍යතා සහ බාසල් III අවම ප්‍රාග්ධන අවශ්‍යතා ක්‍රියාවට නැංවීම සමඟින්ම ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ ප්‍රාග්ධනයක් බැංකු විසින් පවත්වා ගනු ඇතැයි අපේක්ෂිත අතර එලෙස පවත්වා ගත නොහැකි බැංකු ස්වකීය කැමැත්තෙන්ම ඒකාබද්ධ වීම් සඳහා යොමුවීමට දිරිගන්වනු ඇත. තවදුරටත්, ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 9: මූල්‍ය උපකරණ යටතේ 2018 වසරේ සිට බැංකු අපේක්ෂිත ණය හානි ප්‍රවේශය යටතේ ණය හානි වෙන්කිරීම සිදුකළ යුතුය. ඒ අනුව නියාමන අවශ්‍යතාවලට ලඟාවීමට බැංකු තම ප්‍රාග්ධනය වර්ධනය කර ගත යුතුය. මූල්‍ය හා ආර්ථික ආතතීන් තුලින් පැන නැගෙන කම්පනයන්ට මුහුණ දීමට බැංකුවලට ඇති හැකියාව වර්ධනය කරන අතරම පෙර වසර කිහිපය තුළ ආර්ථිකයේ මූල්‍ය අංශයේ සිට මූර්ත අංශයට අවදානම් විකාශය වීමේ අවදානම අවම කරනු ලබයි.

- **බැංකුවල ද්‍රවශීලතා මට්ටම් යහපත් තත්ත්වයක පවතිනු ඇතැයි අපේක්ෂිතය.** බාසල් III ද්‍රවශීලතා ප්‍රමිතීන් යටතේ 2015 වසරේදී නිකුත් කරන ලද ද්‍රවශීලතා ආවරණ අනුපාතය පිළිබඳ බැංකු පනත් විධානයන් යටතේ 2019 වසරේ සිට බැංකු සියයට 100 ක අවම ද්‍රවශීලතා ආවරණ අනුපාතයක් පවත්වා ගත යුතුය. ද්‍රවශීලතා ආවරණ අනුපාතය, මඟින් තහවුරු කරනු ලබනුයේ බැංකු සතුව ද්‍රවශීලතා ආතති අවස්ථාවකදී මුදල් බවට පහසුවෙන් හා ක්ෂණිකව පරිවර්තනය කරගත හැකි නොබැඳුනු ඉහළ ගුණාත්මකබාවයකින් යුතු ද්‍රවශීල වත්කම් තොගයක් දින 30 කට සරිලන මට්ටමකින් පවත්වා ගත යුතුය. මීට අමතරව 2019 වසරේදී ශුද්ධ ස්ථායී ආවරණ අනුපාතය (NSFR) ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත අතර එමඟින් බැංකුවලට ප්‍රමාණවත් ස්ථායී අරමුදල් ප්‍රවාහයක් පවත්වා ගැනීම අනිවාර්ය කිරීමෙන් බැංකුවල ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය තවදුරටත් ශක්තිමත් කෙරේ.

- **මූර්ත ආර්ථිකය තුළින් බැංකු අංශයට විහිදී යන අවදානම්වලට මුහුණ දීම සඳහා සාර්ව ආර්ථික විචල්‍යවල වෙනස්කම් හඳුනා ගැනීමට ඒවා සමීපව නිරීක්ෂණය කරමින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට බලපාන අනාගත අවදානම්වලට නිසි පරිදි මුහුණදීම සඳහා සුදුසු සාර්ව විචක්ෂණශීලී උපායමාර්ග හඳුන්වා දීමට අපේක්ෂිතය.** තවද, ඵලදායී බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් මූලික ප්‍රතිපත්ති සහ අනෙකුත් ජාත්‍යන්තර සහ කලාපීය යහභාවිතාවලට අනුකූලව නියාමන සහ සුපරීක්ෂණ රාමුව ශක්තිමත් කිරීමට ද අපේක්ෂිතය. බැංකු සහ බැංකු අංශයේ කාර්යක්ෂමතාව, සඵලදායීතාව සහ තිරසාරභාවය ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් බැංකු පරීක්ෂණ ක්‍රමවේදය වැඩිදියුණු කෙරෙනු ඇත.

- **කාණ්ඩදාම (Block Chain) වැනි අධිතාක්ෂණික නවතාවයන් සහ මූල්‍ය තාක්ෂණයේ (Fintech) පැනනැගීම් සමඟ බැංකුවල ව්‍යාපාර ආකෘතීන් කාලානුගතව විශාල වෙනස්වීම් වලට මුහුණ දෙනු ඇති අතර නව ව්‍යාපාර අවස්ථාවන්ද එමගින් බිහිවනු ඇත.** තවද මෙම නව්‍ය තාක්ෂණයන් සමගින් බැංකු ක්ෂේත්‍රයට නව අවදානම් සඳහා මුහුණ දීමට සිදුවනු ඇති අතර බැංකු පද්ධතියේ සුරක්ෂිතතාව සහ අඛණ්ඩතාවය තහවුරු කරගනිමින් මෙම නව තාක්ෂණයන් උපයෝගී කරගැනීම සඳහා බැංකු උනන්දු කෙරෙනු ඇත.

- **බැංකු ක්ෂේත්‍රයේ සයිබර්-ආරක්ෂණ සහ මූල්‍ය-තාක්ෂණ යන විෂය පථයන්ට අදාළ අන්තර්ජාතික ප්‍රමිති සහ ප්‍රශස්ත ක්‍රියාපටිපාටිවලට අනුගතව බැංකු සුපරීක්ෂණ සහ නියාමන රාමුවට අවශ්‍ය වෙනස්කම් හඳුන්වා දෙනු ඇත.** මේ යටතේ පැන නැගෙන නව තොරතුරු අවශ්‍යතා කඩිනමින් සැපයීමේ අරමුණ ඇතිව බැංකුවල තොරතුරු පද්ධතීන් සහ අනෙකුත් සම්බන්ධිත තොරතුරු පද්ධතීන් ශක්තිමත් කිරීම සහ ඉහළ නැංවීමට යෝජිත නියාමන කටයුතු කෙරෙනු ඇත. මේ සම්බන්ධයෙන් මහ බැංකුව විසින් බැංකු ක්ෂේත්‍රයේ තාක්ෂණික අවදානම් සඳහා මුහුණ දීමට ඇති හැකියාව ඉහළ නැංවීම පිළිබඳ ඉදිරි දැක්මක් (Road Map) නිකුත්කරන ලද අතර මෙය 2018 සිට 2020 දක්වා ක්‍රියාවට නැංවෙනු ඇත.

- **රටපුරා ආර්ථික කටයුතු සඳහා දායකත්වය දැක්වීමට සහ මූල්‍ය අන්තර්ගතකරණය වැඩිදියුණු කිරීම ඉලක්කගත කරමින් මෙරට බැංකුකරණ ප්‍රවේශයන් ඉහළ දමමින් බැංකු ක්ෂේත්‍රය ව්‍යාප්ත කිරීමට අපේක්ෂිතය.** ජංගම දුරකථන බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය වැනි ඩිජිටල් නව්‍යකරණයන් උපයෝගී කර ගනිමින් තොරතුරු තාක්ෂණ සේවා බෙදා හැරීමේ මාධ්‍යයක් ලෙස යොදා

8

ගැනීම ඉහළ නැංවීමටත් එමඟින් බැංකුකරණය සඳහා ඇති ප්‍රවේශයන් ඉහළ දැමීමටත් අපේක්ෂිත වේ. මෙහිදී සියලු පද්ධති සම්බන්ධව තොරතුරු තාක්ෂණ අවදානම් කළමනාකරණය ශක්තිමත් කිරීම සහ නිවාරක ක්‍රියාමාර්ග ගැනීම බැංකු විසින් අවශ්‍යයෙන්ම සිදුකළ යුතුය.

- **බැංකු ක්ෂේත්‍රයේ භූගෝලීය ව්‍යාප්තිය පුළුල් කිරීමේ අරමුණින් විශාල බැංකුවලට කලාපය තුළ ව්‍යාප්ත වීමේ ඉඩ ප්‍රස්තා සොයා බැලීම සඳහා දිරිමත් කරනු ලබන අතර මේ සඳහා කලාපයේ නියාමකයන් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමේ සහ අන්තර් දේශ සීමා නියාමන කටයුතු වැඩිදියුණු කිරීමේ අරමුණ පෙරදැරිව සමීප සබඳතාවයක් පවත්වාගෙන යනු ලැබේ.**

- **බැංකුවල ප්‍රාග්ධන සහ ද්‍රවශීලතා මට්ටම් ශක්තිමත් කිරීමට ගන්නා නියාමන ප්‍රයාසයන් සහ අවදානම් කළමනාකරණය සහ ආයතනික යහපාලනයේ අපේක්ෂිත වර්ධනය සැලකිල්ලට ගනිමින් බැංකු ක්ෂේත්‍රයේ ස්ථායිතාව පවත්වා ගෙන යනු ඇතැයි බලාපොරොත්තු වේ.** තවද, ඉදිරියේදී නව සොයාගැනීම් මැඩ නොපවත්වමින් ඩිජිටල් යුගය නිසා පැනනගින අවදානම් අවම කිරීමට අවශ්‍ය ඵලදායී නියාමනයන්ගේ පැවැත්ම තහවුරු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව බලාපොරොත්තු වේ.

- **හිමිකම් සීමා සම්බන්ධව විධානයන් නිකුත්කිරීම සමාගම්වල හිමිකම සහ තීරණ ගැනීම ප්‍රධාන කොටස් හිමිට හෝ ප්‍රධාන කොටස්හිමිට සම්බන්ධිත වෙනත් කොටස් හිමියන් කිහිපදෙනෙකුට පමණක් සන්කේන්ද්‍රණය වී තිබීම මඟින් දුර්වල ආයතනික යහපාලන ක්‍රමවේදයන් සමාගම් විසින් අනුගමනය කිරීම, මුදල් සමාගම් අසාර්ථක වීම සඳහා බලපාන එක් හේතුවක් ලෙස හඳුනාගෙන ඇත.** බලපත්‍රලාභී මුදල් සමාගම්වල හිමිකම් සීමාවන් සම්බන්ධයෙන් අංශයේ අදහස්ද සහිතව ක්‍රියාත්මක කිරීම සඳහා වසර 3-4 ක කාල පරිච්ඡේදයක් ලබා දෙමින් දෙපාර්තමේන්තුව විසින් විධාන නිකුත් කිරීමට අපේක්ෂිතය. හිමිකම් සීමාවන් සකස් කිරීමේදී, සමාගමේ කාර්යසාධනය, අනුකූලතා මට්ටම, හිතකර ආයතනික යහපාලනය, ක්‍රියාත්මක කරන ලද ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම් සහ සමස්ත මූල්‍ය අංශයේ සංවර්ධනයන් වැනි සාධක සැලකිල්ලට ගනු ලැබේ.

- **පවත්නා නියාමන රාමුවෙහි සිදුකෙරෙන වෙනස්කම් සමඟ මධ්‍යකාලීනව මෙම අංශයේ ස්ථායිතාවය තවදුරටත් යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.** ප්‍රාග්ධන අවශ්‍යතාවල වර්ධනය හා සමගාමීව අංශයේ අවදානම් දරා ගැනීමේ හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් විශේෂයෙන්ම ද්‍රවශීලතා සහ වෙන්කිරීමේ අවශ්‍යතා වැනි විධාන වලට හඳුන්වා දිය යුතු වෙනස්කම් 2018 වසරේ දෙවන භාගයේදී යෝජනා කරන ලදී. දේශීය හා විදේශීය ණයගැනීම් සම්බන්ධයෙන් සීමාවන් පමුණුවමින් ණය ගැනීමේ අවශ්‍යතා සම්බන්ධයෙන් නව විධානයක් නිකුත් කෙරෙනු ඇත.

- **අර්බුද නිරාකරණය කිරීමේ නිසි රාමුවක් පිහිටුවන ලදී.** දුෂ්කරතාවයට පත් ඇතැම් මුදල් සමාගම්වල අර්බුද නිරාකරණය කිරීම සඳහා යෝජිත මූලික ක්‍රියාමාර්ග තුළින් ධනාත්මක ප්‍රතිඵලයක් අපේක්ෂා කෙරේ. 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත මඟින් දී ඇති ප්‍රතිපාදන අනුව, ඉතිරි දුෂ්කරතාවයන්ට පත් මුදල් සමාගම්වල අර්බුද නිරාකරණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී. දුෂ්කරතාවයට පත් සමාගම් දෙකක බලපත්‍ර අහෝසි කර ඇති අතර ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ද්‍රවශීලතා ආධාරක වැඩසටහන මඟින් ඒවායේ තැන්පත් මුදල් පියවීම සඳහා කටයුතු කෙරෙමින් පවතී. ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුව මඟින් දුෂ්කරතාවයන්ට පත් මුදල් සමාගම්වල අර්බුද නිරාකරණය කිරීම කඩිනම් කිරීම සඳහා පහසුකම් සැලසීමට, මුදල් ව්‍යාපාර පනතට අවශ්‍ය කෙරෙන වෙනස්කම් සිදු කිරීමට අපේක්ෂිතය. යෝජිත වෙනස්කම් මඟින් අවස්ථානුකූලව දුෂ්කරතාවයට හෝ බුන්වත් තත්ත්වයට පත් බලපත්‍රලාභී මුදල් සමාගමක් සම්බන්ධයෙන් නිරාකරණ හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත හඳුනාගත් බලතල පවරා දීමට මුදල් මණ්ඩලයට හැකිවනු ඇත.

- **නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් නිරාකරණ සහ බලගැන්වීම් යන විෂයන් දෙකට ම අදාළව නිසි කාර්යාවලීන් ආරම්භ කරන ලද අතර අවශ්‍ය මෙහෙයුම් පටිපාටීන් ද සකස් කර ගන්නා ලදී.** ගැටළු සහිත මූල්‍ය ආයතන ගණනාවක වංචා සහ අවභාවිතාවන්ට සම්බන්ධ යැයි සැක කෙරෙන අධ්‍යක්ෂවරුන්ට විරුද්ධව නීතිමය පියවර ගැනීම සඳහා නියාමන අධිකාරියත්, නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවත් හරහා දැනටමත් කටයුතු ආරම්භ

කර ඇත. තවද, නීති විරෝධී මූල්‍ය ව්‍යාපාර සහ තහනම් යෝජනා ක්‍රම සම්බන්ධයෙන් පිළිවෙළින් මූල්‍ය ව්‍යාපාර පනතේ සහ බැංකු පනතේ අදාළ වන විධිවිධාන ප්‍රකාරව විමර්ශන රැසක් ම සිදු කරන ලදී. නීති විරෝධී මූල්‍ය ව්‍යාපාර සහ තහනම් යෝජනා ක්‍රමවල අහිතකර ප්‍රතිවිපාක සම්බන්ධව මහ ජනතාව දැනුවත් කිරීම උදෙසා නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩමුළු ගණනාවක් ද පවත්වන ලදී.

- **මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුවෙහි පෙන්වා දී ඇති පරිදි විචක්ෂණශීලී අවදානම් මට්ටමකට අනුරූපව, හැකි අවම පිරිවැයක් යටතේ රජයේ මූල්‍යන අවශ්‍යතා සපුරාලීම සහතික කිරීම සඳහා යෝග්‍ය සංයුතියකින් යුතුව රජයේ මුදල් ප්‍රවාහ අවශ්‍යතා පූරණය වන ලෙස මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගය සැළසුම් කර ක්‍රියාත්මක කරයි.** තවද, මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ගයන් පැහැදිලි කිරීමේදී හා ක්‍රියාවට නැංවීමේදී රජය විසින් බාහිර කම්පනවල බලපෑම අවම කරගැනීමේ ක්‍රියාමාර්ග පිළිබඳවද සළකා බලයි. දිගුකාලීන තිරසාර රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තීන් පිළිබිඹු කරමින් දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි) ප්‍රතිශතයක් ලෙස ණය අනුපාතය 2016 අවසානයේදී වාර්තා වූ සියයට 78.8 ට සාපේක්ෂව 2017 අවසානයේදී සියයට 77.6 දක්වා අඩුවිය. සාර්ව ආර්ථික වාතාවරණය වැඩිදියුණු වීමත් සමඟ අපේක්ෂිත ප්‍රාථමික අතිරික්තයන් උත්පාදනය වීම තුළින් රජයට ණය එක්රැස්වීම අඩුකරගැනීමට සහ ඒ තුළින් ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස ණය සහ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස අයවැය හිගය යන අනුපාතයන්, මැදිකාලීනව අඩුකරගැනීමට හැකිවනු ඇත. තවද, සක්‍රිය වගකීම් කළමනාකරණ පනත (ALMA) ක්‍රියාවට නැංවීම මඟින් රජයට නියමිත කාලයට පෙර ප්‍රතිමූල්‍යන අවශ්‍යතාවලින් කොටසක් සක්‍රීය ලෙස පියවාගැනීමට සහ මධ්‍යකාලීනව, දේශීය හා විදේශීය ණය වල කල්පිරීමේ කාල සීමාව දීර්ඝ කරගැනීමටද හැකිවනු ඇත. පොදුවේ මෙම ක්‍රියාවලිය, ආයෝජන පදනම විවිධාංගීකරණය කිරීමට, පවත්නා වෙළඳපොළ අනුපාතිකයන් තුළින් තරගකාරී අනුපාතිකයන්ට ණය ගැනීමට, ණය කළඹෙහි කාලසීමාව දීර්ඝ කරගැනීමට, මෑත කාලීනව ප්‍රතිමූල්‍යනය කිරීමේ අවදානම අවම කිරීමට සහ ඕනෑම නව නිකුතූන් සඳහා හිතකර මිල තරගකාරීත්වයක් ඇති කර ගැනීමට රජයට උපකාරී වනු ඇත.

- **සිය රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් හසුරුවා ගැනීමට වැඩි ඉඩකඩක් ලබාගැනීම තුළින් මධ්‍යකාලීන ණය කළමනාකරණ ඉලක්ක සපුරා ගැනීම සඳහා ආදායම මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය හා බැඳුනු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීමේදී රජය විසින් ස්ථිර ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.** ණය සේවාකරණ වියදම් තවදුරටත් අඩුකරගන්නා අතරම දේශීය ණය කළඹෙහි සාමාන්‍ය කල් පිරීමේ කාලය දිගුකර ගැනීමට සහ සමස්ත දේශීය ණය කළඹෙහි කෙටිකාලීන දේශීය ණය ප්‍රතිශතය හා සමස්ත ණය කළඹෙහි කෙටිකාලීන විදේශීය ණය ප්‍රතිශතය අඩුකර ගැනීමට අවශ්‍යකරන උපායමාර්ග ක්‍රියාවට නංවනු ඇත. සම්පත්වලට ඇති ප්‍රවේශය, කල්පිරීම් වක්‍රයේ ඒකරාශී වීම් සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ ගමන්මග යන කරුණු මත පදනම් වෙමින් අදාළ අවශ්‍ය ඉඩකඩ නිර්මාණය කරගැනීමේ අරමුණින්, මධ්‍යකාලීන ණය සේවාකරණ ගෙවීම්, උපායමාර්ගික ලෙස සකස් කර ඇත. ඒ හා සමානව, අඩු පොලී අනුපාතික යටතේ භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමෙන්, මධ්‍යකාලීනව ණය සේවාකරණ ගෙවීම් සුමටනය කරනු ඇති අතර, සාමාන්‍ය කල්පිරීමේ කාලයද ඉහළ නංවනු ඇත. තවද, ශ්‍රී ලංකා රජයෙහි ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම ශක්තිමත් කිරීම සඳහා අන්තර්ජාතික ශ්‍රේණිගත කිරීමේ ආයතන සමඟ අඛණ්ඩ සංවාදයක් පවත්වාගෙන යනු ඇත.

- **රජය මධ්‍යකාලීන ණය කළමනාකරණ උපායමාර්ග යෙහි කොටසක් ලෙස, යුරෝ-ඩොලර්-නොවන බැඳුම්කර නිකුතු හරහා අනාගත ණය සේවාකරණ, විකල්ප වෙළඳපොළ මූල්‍යන ක්‍රම හරහා සිදුකර ගැනීමේ ශක්‍යතාවයද සොයා බලමින් සිටියි.** ශක්තිමත් රාජ්‍ය සම්බන්ධතා උපයෝගී කර ගනිමින් විකල්ප වෙළඳපොළ තුළ පවතින අවස්ථාද මේ වන විට සළකා බලමින් පවතී. මේවා අතර, සමුරායි බැඳුම්කර, පැන්ඩා බැඳුම්කර සහ ඒකාබද්ධ ණය සඳහා ප්‍රවේශයන් අන්තර්ගත අතර වියදම් හා අවදානම් අරමුණු සඳහා ප්‍රමුඛත්වය ලබාදෙමින් සම්ප්‍රදායික නොවන වෙළඳපොළවල තිබිය හැකි නිකුතු ඉහළ නැංවීමේ අවස්ථාද අන්තර්ගත වේ.

- **රාජ්‍ය ආදායම පදනම් කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලියේ දැඩි ලෙස පිළිපැදීම සහ සක්‍රිය වගකීම් කළමනාකරණ පනත ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම, රටේ අපේක්ෂිත ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම සපුරා ගැනීම සහ පවත්වාගෙනයෑම සඳහා**

**අවශ්‍ය වන ප්‍රධාන සාධක වේ.** තවද, ඇමරිකා එක්සත් ජනපදය සහ ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට (OECD) අයත් අනෙකුත් ප්‍රධාන රටවල පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ නැංවීම හේතුවෙන් වාණිජ ණය ගැනීම්වල වියදම ඉහළ යෑම හා සහනදායී හා ව්‍යාපෘති ණය ලැබීම් අඩුවීම හේතුවෙන් ආයෝජන ප්‍රභව කාලීනව විවිධාංගීකරණය කිරීමට අවශ්‍ය වනු ඇත. තවද, දැනට ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් උපයන රටක් ලෙස පත්වීම හේතුවෙන් දැනට පවත්නා සහන සහ ව්‍යාපෘති ණය සම්බන්ධ ණය සේවාකරන ගෙවීම්ද වේගවත් විය හැකිය.

- **ජාතික ගෙවීම් කවුන්සිලය මගින් පත්කරන ලද මූල්‍ය තාක්ෂණ කමිටුවෙහි නිර්දේශ 2019 දී ක්‍රියාත්මක කරනු ලබයි.** ගනුදෙනුකරුවන්ගේ පහසුව වැඩි කිරීමට, ආරක්ෂාව සහ විවිධ ගෙවීම් යාන්ත්‍රණ හා උපකරණවල අන්තර් ක්‍රියාකාරිත්වය සහතික කිරීමට දේශීය මුදල් ගෙවීම් සඳහා 2018 ඔක්තෝබර් මස හඳුන්වා දුන් ජාතික ක්ෂණික ප්‍රතිචාර (QR) කේතය ක්‍රියාත්මක කිරීම සහ ජනප්‍රිය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව පහසුකම් සපයනු ලබයි. ජාතික මාර්ගස්ථ කාඩ්පත සහ ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීම සහ ගාස්තු එකතු කිරීමේ යටිතල පහසුකම් රාමුව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලබයි. මෙම ආරම්භය ප්‍රවාහන කර්මාන්තයේ ගෙවීමේ යාන්ත්‍රණය ප්‍රමිති ගත කිරීම සහ අඩු මුදල් භාවිත සමාජයක් යන ජාතික අභිප්‍රාය සඳහා දායක වේ. නියාමන අඩුපාඩු හඳුනාගැනීම සහ මූල්‍ය තාක්ෂණයන්ට තම නිපැයුම් සුරක්ෂිත වාතාවරණයක දියුණු කර ගැනීමට අවශ්‍ය උපදේශකත්වය ලබාදීම සඳහා මූල්‍ය තාක්ෂණ නියාමන පරීක්ෂණ අවකාශය (FinTech Regulating Sandbox) පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ කරනු ලබයි.

- **බ්ලොක්චේන් තාක්ෂණය පිළිබඳ අධ්‍යනය කිරීමට පත්කල කමිටුවේ නිර්දේශයක් ලෙස, මූල්‍ය ක්ෂේත්‍රයේ බ්ලොක්චේන් යොදාගැනීම් තවදුරටත් අධ්‍යනය කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී.** මෙම කමිටුව බ්ලොක්චේන් තාක්ෂණය මූල්‍ය ක්ෂේත්‍රයේ යෙදවුම්වලට භාවිතා කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යනය කර වාර්තාවක් 2019 දී පිළිගන්වනු ඇත.

- ජාතික ගෙවීම් කාඩ්පත් ක්‍රමය (NCS) යටතේ නිකුත් කරනු ලබන ගෙවීම් කාඩ්පත් භාවිතා කර සිදු කරනු ලබන ගනුදෙනු මාරු කිරීමට සහ මාර්ගගත කිරීමට පහසුකම් සැලසීම පිණිස ගෙවීම් කාඩ්පත් පිළිබඳ මූල්‍ය අත්පත්කරුවන් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය (CPS) සමඟ සම්බන්ධ වීම ශ්‍රී ලංකා මහබැංකුව විසින් අධීක්ෂණය කරනු ලබයි.